අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. ED/ 1 / 1 / 3/2/-i
ඔබේ අංකය / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2020.09 . 23

# සමස්ත ලංකා පාසල් සංගීත තරගය - 2021 - චක්‍රලේඛ අංකය - 31/2020

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන සමස්ත ලංකා පාසල් සංගීත තරගය සෞන්දර්ය ශාඛාවෙන් මෙහෙයවනු ලබයි. ඒ හා සම්බන්ධ , 2021 වසරට අදාළ චක්‍රලේඛය යි.

## තරගය පිළිබඳ පොදු නීති රීති

01. රජයේ පාසල් (පිරිවෙන් විද්‍යායතන ද ඇතුලත්ව), රජයේ අනුමත පාසල් සහ අර්ධ රාජ්‍ය පාසල්, මෙන් ම විශේෂයෙන් සඳහන් කර ඇති තරග ශීර්ෂ යටතේ, පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල්වලට ද ඉදිරිපත් විය හැකිය.

1.01. සහභාගී වන තරග කරුවන් ප්‍රධාන කොටස් පහකට බෙදේ.

1. ප්‍රාථමික කොටස - 1 සිට 5 ශ්‍රේණිය දක්වා
2. කණිෂ්ඨ කොටස - 6 සිට 8 ශ්‍රේණිය දක්වා
3. ජ්‍යෙෂ්ඨ කොටස - 9 සිට 13 ශ්‍රේණිය දක්වා
4. විවෘත කොටස - 1 සිට 13 ශ්‍රේණිය දක්වා
5. විශේෂ කොටස - 11 සිට 13 ශ්‍රේණිය දක්වා

1.02. ජ්‍යෙෂ්ඨ කොටසේ තරග, පහත පරිදි උප කොටස් තුනකින් යුක්ත වේ.

- ජ්‍යෙෂ්ඨ (1) - 9 සිට 13 ශ්‍රේණි (සමූහ)
- ජ්‍යෙෂ්ඨ (2) - 9 සිට 11 ශ්‍රේණි (ඒකල)
- ජ්‍යෙෂ්ඨ (3) - 12 සිට 13 ශ්‍රේණි (ඒකල)

1.03. ඉහත කොටස් යටතේ මෙම තරගය පහත සඳහන් පරිදි අංශ හතරකට බෙදා ඇත.

1. ගායන අංශය 2. වාදන අංශය 3. සංගීතමය නාට්‍ය නිර්මාණ අංශය

1.04. ඉහත අංශ ඒකළ, යුගල සහ සමූහ වශයෙන් වඩාත් සුවිශේෂී ව බෙදේ.

1.05. එම තරග අංශ, තරග ශීර්ෂ කාණ්ඩ වශයෙන් දක්වා ඇති අතර, තරග ශීර්ෂ කාණ්ඩයක් ඉහත අංක 1.01 , 1.02, 1.03 හා 1.04 යන වගන්තිවල ඇතුලත් තොරතුරු වලින් සමන්විත වේ.

1.06. යම් තරග ශීර්ෂ කාණ්ඩයක් ගැහැණු , පිරිමි, මිශ්‍ර හා පොදු ලෙස අවම වශයෙන් ශීර්ෂ එකකින් හෝ උපරිම වශයෙන් ශීර්ෂ හතකින් සමන්විත විය හැකි ය.පොදු යන්නෙන් අදහස් වන්නේ සිසුන් 500 ට අඩු සහ 501– 1000 අතර සංඛ්‍යාවක් සිටින පාසල් වල , ගැහැණු, පිරිමි ලෙස වර්ග නොවී ඉදිරිපත් වන ශීර්ෂයි.

1.07. මෙහි ඒ ඒ තරග ශීර්ෂයන් ඉලක්කම් ස්ථාන තුනකින් යුතු කේත අංකයකින් හා ශීර්ෂ නාමයකින් දක්වා ඇත. කේත අංකයන් පහත ආකාරයෙන් සමන්විත වේ.

<u>පළමු අංකය</u> :- 1. ප්‍රාථමික, 2. කණිෂ්ඨ, 3.1. ජ්‍යෙෂ්ඨ (1) , 3.2. ජ්‍යෙෂ්ඨ (2) 3.3. ජ්‍යෙෂ්ඨ (3) 4. විවෘත 5. විශේෂ

<u>දෙවන අංකය</u> :- 1. ගායන 2. වාදන 3. සංගීතමය නාට්‍ය නිර්මාණ(ජ්‍යෙෂ්ඨ කොටසේ දී මෙය තෙවන අංකයයි.)

<u>තෙවන අංකය</u>:- ඒ ඒ ශීර්ෂයන්ට අනුව අනුක්‍රමික ව වෙනස් වේ. ( ජ්‍යෙෂ්ඨ කොටසේ දී මෙය සිව්වන අංකයයි.)

1.08 සෑම විටම තරගවලට අදාළ පොදු කොන්දේසි පෙළ ගස්වා ඇත්තේ අදාළ ශීර්ෂ වලට පසුව බැවින්, යම් තරග කොන්දේසියක් අදාළ වන්නේ ඊට ඉහළින් දක්වා ඇති තරග ශීර්ෂයට හෝ ශීර්ෂවලට ය .

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

## <u>02. සහභාගීත්වය</u>

**2.1** පාසල් වර්ගීකරණය අනුව, 1 AB වර්ගයේ පාසල් සඳහා පමණක් සහභාගී විය හැකි තරග ශීර්ෂ කිහිපයක්ද , 1C වර්ගයේ පාසල් වලට පමණක් සහභාගී විය හැකි තරග ශීර්ෂ කිහිපයක් ද , 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල්වලට පමණක් සහභාගී විය හැකි තරග ශීර්ෂ කිහිපයක් ද, ඊට අමතර වශයෙන් සිසු සංඛ්‍යාව 500 අඩු සහ 501 – 1000 ත් අතර සිටින පාසල් සඳහා පමණක් සහභාගී විය හැකි තරග ශීර්ෂ කිහිපයක් ද මෙම චක්‍රලේඛයේ නිර්දේශ කර ඇත. අදාළ තරග ශීර්ෂ යටතේ එම කොන්දේසි සඳහන් කර ඇත. එකී කොන්දේසි සඳහන් කර නොමැති තරග ශීර්ෂ සඳහා ඉහත කී ඕනෑම පාසලකට උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව තුනකට යටත්ව ඉදිරිපත් විය හැකිය. එමෙන්ම 2.6 iii යටතේ සඳහන් කර ඇති විශේෂ තරග ශීර්ෂ සඳහා ද, අදාළ කොන්දේසි අනුව සහභාගී විය හැකිය. ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසල් වලට ඉදිරිපත් විය හැකි වන්නේ ඒ සඳහා වෙන් කරන ලද තරග ශීර්ෂ සඳහා පමණි. **විදුහල්පතිවරුන් විසින් තම පාසලේ වර්ගීකරණ කේතය තරග අයදුම් පතෙහි සඳහන් කර සහතික කළ යුතු ය. යම් පාසලක් ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් තරගයට ඉදිරිපත් වන්නේ නම් පාසල් වර්ගීකරණ කේතය අදාල නොවේ.**

**2.2** පහත සඳහන් ආකාරයට එක් පාසලකට සහභාගී විය හැකි <u>උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාව නවයකි</u>.

I. ප්‍රාථමික අංශය සඳහා <u>**තරග ශීර්ෂ උපරිම හතරකි**</u>. (1.1.1. සිට 1.2.9 දක්වා)
II. 6 – 13 ශ්‍රේණි සඳහා <u>**තරග ශීර්ෂ උපරිම තුනකි.**</u> (2.1.1. සිට 4.3.4 දක්වා)
III. විශේෂ කොටසින් <u>**තරග ශීර්ෂ උපරිම දෙකකි.**</u> (5.1.1. සිට 5.3.6 දක්වා)

**2.3** මෙම තරගයට යම් පාසලක 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, එම විදුහල මගින් දෙවන වර උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ විභාගය හෝ සඳහා, තරගය පවත්වනු ලබන වර්ෂයේ පෙනී සිටින සිසු සිසුවියන්ට ද සහභාගී විය හැකි ය.

**2.4** අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගේ/පළාත් අධ්‍යාපන ලේකම්ගේ /අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ /කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ /පළාත් සෞන්දර්ය /සංගීත විෂය භාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව, යම් පාසලකට එය අයත් වන පළාතේම වෙනත් පාසලක සංගීත ගුරුභවතුන් හෝ සිසු සිසුවියන් හෝ සහාය වාදනය සඳහා සහභාගී කර ගත හැකිය. එමෙන්ම සහාය වාදනය සඳහා, ගුරු භවතුන් සහභාගී වන්නේ නම්, උපරිමය ගුරුවරුන් 02 කට සීමා විය යුතු ය.

**2.5** සහාය වාදනය සඳහා සම්බන්ධ වන සිසු සිසුවියන්ට, ඔවුන් සහභාගී වන තරග ශීර්ෂයට නියමිත වයස් සීමාවන් අදාළ නොවේ. එමෙන්ම ගැහැණු/පිරිමි ලෙස වර්ගීකරණයට ලක් නොවේ.

**2.6** පෞද්ගලික හෝ ජාත්‍යන්තර හෝ පාසලකට රජයේ පාසලක/පිරිවෙනක ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් හෝ සහාය වාදනය සඳහා යොදා ගත හැකි වුවත් , රජයේ පාසලකට, පිරිවෙනකට, පෞද්ගලික හෝ ජාත්‍යන්තර හෝ පාසලක ගුරු භවතුන් සහ සිසු සිසුවියන් සහාය වාදනය සඳහා යොදවා ගත නොහැකිය.( රජයෙන් පත් කළ ගුරු සහායකයින් ද මෙම තරගයට ඉදිරිපත් වන ගුරු වර්ගයෙහි ලා සලකනු ලැබේ.

**2.7** කිසියම් තරගකරුවකු කලාප තරගයට අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණිය යටතේ ම සමස්ත ලංකා අවසාන තරගය දක්වාම ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. එමෙන්ම කලාප තරගයට අයදුම් කරන අවස්ථාවේ ඉගෙනුම ලබමින් සිටි පාසල නියෝජනය කරමින් සමස්ත ලංකා අවසාන තරගය දක්වා සහභාගී වීමට ද සුදුසුකම් ලබයි .

2.8 එක් වර්ෂයක දී එකම සිසුවකුට හෝ සිසුවියකට හෝ තරග ශීර්ෂ අංක 1.1.1. සිට 4.3.4 දක්වා ඒකල තරග ශීර්ෂ එකකට වඩා ඉදිරිපත් විය නොහැකිය. සුවිශේෂී දක්ෂතා ඇති සිසුන් සඳහා මෙම චක්‍රලේඛයේ තරග ශීර්ෂ අංක 5.1.1 සිට 5.3.6 දක්වා වෙන් කර ඇති ඒකල තරග ශීර්ෂ වලට ඉහත සඳහන් උපරිම තරග ශීර්ෂ සංඛ්‍යාවට අමතර වශයෙන් එක් පාසලකින් උපරිමය තරග ශීර්ෂ 02 ක් දක්වා සිසුන් ඉදිරිපත් කල හැකිය. මෙම තරග ශීර්ෂ සඳහා අයදුම් කරන වර්ෂයට පූර්වාසන්න වසරට නියමිත තරගයේ මෙම තරග ශීර්ෂ වලින් ජාතික මට්ටමේ ප්‍රථම ස්ථාන ජයග්‍රහණ ලබා ගත් තරගකරුවන්ට ඉදිරිපත් වීමට හැකියාව නැත. වෙනත් ඒකල තරග ශීර්ෂ වලින් ජාතික මට්ටමේ ජයග්‍රාහකයින්ට මේ සඳහා ඉදිරිපත් විය හැකි අතර, අදාළ වසරට නියමිත තරගයේ වෙනත් ඒකල තරග ශීර්ෂයකට අයදුම් කරන තරගකරුවෙකු ට ඊට අමතරව උපරිම වශයෙන් මෙම තරග ශීර්ෂ එකක් සඳහා ද ඉදිරිපත් විය හැකිය. (ප්‍රාථමික කොටසේ ඒකල හා සමූහ ගායන/වාදන තරග සඳහා මෙම කොන්දේසි අදාල නොවේ).

2.9 අයදුම් කරන වර්ෂයට පූර්වාසන්න වසරේ පැවැත්වූ තරගයෙන් සමස්ත ලංකා මට්ටමේ දී ප්‍රථම හෝ දෙවන හෝ තෙවන හෝ වශයෙන් ජයග්‍රහණයක් ලැබූ පාසල්වලට මෙම වර්ෂයේ දී <u>**එම තරග ශීර්ෂ වලින්ම**</u> ඉදිරිපත් විය නොහැකිය. එහෙත් ඒකල තරග වලදී එම පාසලේ ම වෙනත් සිසුවකුට /සිසුවියකට එම ශීර්ෂයෙන් ඉදිරිපත් වීමට තහනමක් නැත.(2.8 කොන්දේසිය ද බලන්න.) ප්‍රාථමික කොටසේ ගායන / වාදන තරග සඳහා මෙම කොන්දේසි අදාළ නොවේ.

2.10 ''සමූහ-මිශ්‍ර'' ගායනා තරග වලදී ගායනය සඳහා සහභාගී වන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන්ගේ සංයුතිය එක් වර්ගයකින් 4 දෙනෙකුට වඩා නො අඩු විය යුතුය.(පොදු තරග ශීර්ෂ සඳහා අදාළ නොවේ)

2.11 මෙම තරගය සඳහා නිර්මාණය කරන ගී පදමාලා ආදිය ජාති ආගම්, කුල භේද වලට හෝ පටු දේශපාලනික අදහස් උදහස් වලට හෝ තුඩු නො දෙන එවැනි අදහස් ගම්‍ය නො වන, පාසල් සිසුන්ට උචිත ඒවා විය යුතු ය. එම ගී පදමාලා තරගයට ඉදිරිපත් වීමට ප්‍රථම විනිශ්චය මණ්ඩල වෙත ලබා දීම සඳහා තරග මණ්ඩලයේ ප්‍රධාන සංවිධායක වෙත ලබා දිය යුතුය.

2.12 කලාපීය සහ පළාත් තරග අවස්ථාවන් හිදී සුවිශේෂී ඇඳුම් ආයිත්තම් වලින් තරගයට ඉදිරිපත් වීම නොකල යුතු අතර පාසල් නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතුය.(සංගීතමය නෘත්‍ය/නාට්‍ය තරග වලට පමණක් මෙය බල නොපානු ඇත.)ජාතික තරග අවස්ථාවේ දී ,උචිත ප්‍රාසාංගික ඇඳුම් පැළඳුම් සහිතව ඉදිරිපත් විය යුතුය. එම ඇඳුම් පැලඳුම් පාසල් පද්ධතියට උචිත හා සංවරශීලී ඒවා විය යුතු අතර, ඒ පිළිබඳ පූර්ණ වගකීම අදාළ විදුහලේ විදුහල්පති හා විෂය භාර/කණ්ඩායම භාර ගුරු භවතුන් සතුවේ.

2.13 විවෘත නාට්‍ය නිර්මාණ (ගීත නාට්‍ය) (4.3.2) තරග ශීර්ෂය හැර වෙනත් කිසිදු තරග ශීර්ෂයක දී වේදිකා පසුතල නිර්මාණ, අලංකරණ උපාංග, සැරසිලි හා නිර්මාණාත්මක උපාංග කිසිවක් භාවිතා කිරීම සපුරා තහනම් වේ.

2.14 අවසාන තරග කාල සටහනෙහි, අදාළ ශීර්ෂ සඳහා වෙන් කර ඇති කාල සීමාව තුල දී සහභාගී නොවන පාසල්, එම ශීර්ෂයන්ට ඉදිරිපත් නොවන්නා සේ සලකා ප්‍රතිඵල ලබා දීම සිදුවේ.

2.15 තරගයට ඉදිරිපත් වීම සඳහා වේදිකා ගත වූ පසු සංගීත භාණ්ඩ ආදිය සුසර කිරීමට විනාඩි 02 කට වැඩි කාලයක් නො ගත යුතු වේ.

## <u>03.තරගයට ඉදිරිපත් වීම</u>

3.01 පළමු තරග අවස්ථාව වන කලාප තරගය සඳහා චක්‍රලේඛ ගත ආදර්ශ අයදුම්පත අනුව ඉල්ලුම් පත්‍රය පුරවා අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතුය. මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශයේ සංගීත විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හා සංගීත ගුරු උපදේශකවරුන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය.

3.02 යම් තරග ශීර්ෂයකට සහභාගී විය හැකි තරගකරුවන්ගේ උපරිම හා අවම සංඛ්‍යාවන් ඒ ඒ ශීර්ෂ කාණ්ඩ වලට අදාළ තරග කොන්දේසි යටතේ දක්වා ඇත. තරග අවස්ථාවේ දී සහාය වාදන සඳහා හෝ වාදක මණ්ඩලය මෙහෙය වීම සඳහා එම අංගය පුහුණු කල ගුරු භවතා ද සහභාගී වන්නේ නම්, ඔහු/ඇය ද,සහභාගී වන තරගකරුවන්ගේ සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ.

3.03 තරගකරුවන් සංඛ්‍යාව ලෙස මෙහි ලා සලකනු ලබන්නේ, ප්‍රසංග අංකය ඉදිරිපත් කර අවසාන වන කාලය තෙක් විනිශ්චය මණ්ඩලය අබිමුවෙහි හෝ වේදිකාවෙහි සිටින සංඛ්‍යාවය. යම් හදිසි අවස්ථාවක දී තරගකරුවෙකු තරගය සඳහා ඉදිරිපත් නො කරන්නේ නම් ඔහුගේ /ඇයගේ නම ඉල්ලුම් පත්‍රයෙන් ඉවත් කළ යුතුය. කලාප, පළාත් සහ අවසාන තරග අවස්ථාවන් හි දී සංවිධායක මණ්ඩලය ඉදිරියේ අත්සන් කල යුත්තේ ද ඉදිරිපත් වන සිසු සිසුවියන් සහ ගුරු භවතුන් පමණි.

## 04 තරග විනිශ්චය

4.01 කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාළ පලාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා විසින් ද, තම කලාප/පළාත් සෞන්දර්ය හෝ සංගීත විෂය භාර නිලධාරීන්ගේ නිර්දේශ මත පත් කළ යුතුය. අවසන් තරගයේ විනිශ්චය සංයුතිය තීරණය කරනු ලබනුයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ සංගීත විෂය භාර අධ්‍යක්ෂගේ උපදේශකත්වයෙන් හා සෞන්දර්ය අධ්‍යක්ෂ ගේ අනුමැතිය මතය. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටළුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු බව පෙනීයන්නේනම් පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමග සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදුවේ.

4.02 කලාප/පළාත් තරග සඳහා සුදුසු විනිශ්චය මණ්ඩලයක් නිර්දේශ කිරීම අදාළ කලාපයේ /පළාතේ සෞන්දර්ය හෝ සංගීත විෂය භාර ස.අ.අ. /නි.අ.අ. ගේ වගකීම වේ. විනිශ්චය ලබා දීමේ දී අපක්ෂපාතී ව, වගකීම් සහිතව සහ පරිණතභාවයෙන් යුතුව එහි නිරත විය හැකි ප්‍රවීණයන් ඒ සඳහා නිර්දේශ කිරීමත්, තරග කොන්දේසි හා නීති රීති ඇතුළු අදාළ අනෙකුත් කාරණාවන් අරභයා විනිශ්චය මණ්ඩලය මැනැවින් දැනුවත් කිරිමත් පිළිබඳව අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය /සංගීත විෂය භාර ස.අ.අ. /නි.අ.අ. වගකිව යුතු වේ.

4.03 අදාළ තරග අවස්ථාවෙන් පසුව සියලුම විනිශ්චය සටහන් පත්‍රිකා අදාළ කලාප/පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිතව සුරැකිව තබා ගැනීම කලාපයේ/පළාතේ සෞන්දර්ය /සංගීත විෂය භාර ස.අ.අ. /නි.අ.අ. ගේ වගකීම වේ. තරගයෙන් පසුව ඊට සම්බන්ධ වූ යම් පාසලක්, කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ /අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිරීක්ෂණයට ඉල්ලා සිටිය හොත්, තරග ශීර්ෂයට අදාළ එම සටහන් නිරීක්ෂණයට ඉඩ ලබා දිය යුතුය.

4.04 සමස්ත ලංකා අවසාන තරගයේ දී කිසියම් ඒකල හෝ සමූහ තරග ශීර්ෂයකට තරග වදින කණ්ඩායම් සියල්ල හෝ කිහිපයක් හෝ එකක් හෝ අවශ්‍ය සාධන මට්ටම, එනම් ලකුණු සියයට 33 ක් වන අවම සාධන ලකුණු මට්ටම ඉක්මවා නැති බව විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එම කණ්ඩායමට හෝ කණ්ඩායම් වලට ජයග්‍රහණය ලබා නො දෙනු ඇත.

4.05 ජාතික තරගය පවත්වන දිනයේ දී ම අදාළ තරග ශීර්ෂයන්හි ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. යම් ආකාරයකින් මෙ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පැන නැගී ඇති විටෙක, අදාළ පරීක්ෂණ වලින් පසුව එම ප්‍රතිඵල නිකුත් කෙරේ. සමස්ත තරග මාලාවෙහි තරග අවස්ථාවන්හි දී විනිශ්චයන් හා සම්බන්ධව විනිශ්චය මණ්ඩල සමග කරුණු සාකච්ඡා කිරීමට තරගකරුවන්ට හෝ ගුරු භවතුන්ට අවස්ථාවක් නොලැබෙන අතර, ඒ පිලිබඳ යම් අදහසක් වේ නම් ප්‍රධාන තරග සංවිධායක වෙත පමණක් ලිඛිත ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

4.06 තරගයේ කිසියම් අදියරක දී, ඊට සම්බන්ධ යම් පාර්ශවයක් යම්කිසි වංචනික ක්‍රියාවක නිරත වීම මගින් හෝ වෙනත් ආකාරයකින් තරග ප්‍රතිඵල වලට බලපෑමක් ඇති කර තිබෙන බවට කවර හෝ අවස්ථාවක දී වුවද අනාවරණය වුවහොත් සහ එය පිළිගත හැකි සහ වගකීම් සහගත අනාවරණයක් නම්, ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනු ලැබේ.

4.07 යම් තරග ශීර්ෂයක ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව, වැඩි ලකුණු ලබාගත් පාසලකට විරුද්ධ ව යම් කිසි අභියාචනයක් ඉදිරිපත් වී, චෝදනාවේ බරපතලකම අනුව අදාළ පාසල එම තරග ශීර්ෂයෙන් ඉවත් කරන්නේ නම්, ඊළඟ ඉහලම ලකුණු මට්ටම ලබාගත් පාසලට ජයග්‍රහණ අවස්ථා පිලිවෙලින් හිමි වේ.

## 05. අදාළ වෙනත් කරුණු

5.01 මෙම තරගයේ දි වාර්ෂික චක්‍රලේඛය මගින් නම් කරන ශීර්ෂ සඳහා පමණක් ශ්‍රැතිය පවත්වා ගැනීමට ඉලෙක්ට්‍රොනික තාම්පුරාවක් භාවිතා කළ හැකිය. එමෙන්ම(3.1.2.1/3.1.2.2/3.1.2.3/5.2.24/5.2.25/5.2.26) තරග ශීර්ෂයන් හැර අනෙකුත් සියලු ම තරග ශීර්ෂ සඳහා විද්‍යුත් සංගීත භාණ්ඩ භාවිතා කළ නොහැකිය .

5.02 " ස්කේල් චේන්ජර් " හාර්මෝනියම් භාවිතා කරන්නේනම්, යතුරු පුවරුව වෙනස් කිරීමකින් තොරව වාදනය කල යුතුය.(තරග ශීර්ෂ - 2.2.17 සිට 2.2.20 දක්වා සහ 3.2.2.21 සිට 3.2.2.24 දක්වා)

5.03 භාවිතා කරන ඉලෙක්ට්‍රොනික තාම්පුරා සහ විදුලි ඕගනය(3.1.2.1/3.1.2.2/3.1.2.3/5.2.24/5.2.25/5.2.26 ශීර්ෂයන්ට අදාළ) සඳහා තරගය පවත්වනු ලබන විදුහලේ විදුලිය පරිපථයෙන් විදුලිය සම්පාදනය නො කෙරේ.

5.04 සමූහ ගායන ශීර්ෂ සඳහා වාදනයෙන් සහාය වන්නන් හට ගායනයෙන් සහාය වීම කිසිසේත්ම සිදු කල නොහැකිය.

5.05 අවසාන තරග අවස්ථා වීඩියෝ ගත කිරීමට ක්‍රමවේදයක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සැලසුම් කළ හොත් එම් දර්ශන/තරග හඬපට තරග තීරණ සඳහා අදාළ කර නො ගැනේ. එමෙන්ම තරග අවස්ථා වන්හි දී හදිසි විදුලි ඇනහිටීම් සිදු වුවද (වීඩියෝ කරණයට එය බාධා විය හැකි නමුත් ) තරගය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ.

5.06 තරග අවස්ථා වන්ට සහ සිසු සිසුවියන්ගේ භාරකාරත්වයට දෙමව්පියන්ගේ සහ වෙනත් පාර්ශවයන්ගේ මැදිහත් වීම හෝ සහභාගිත්වය සිදු නො කිරීමට තරයේ වග බලා ගත යුතුවේ.

## 06. සහතික පත්‍ර හා ජය සංකේත

6.01 කලාප හා පළාත් මට්ටමේ තරග වලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරි නැමීම කලාප හා පළාත් මට්ටමින් කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා මෙම අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරි නමනු ලැබේ.

6.02 සමස්ත ලංකා අවසාන තරගයේ සමූහ තරග ශීර්ෂ වලින් ප්‍රශස්ත මට්ටමේ කුසලතා එළි දක්වන ප්‍රසංග අංග සඳහා පහත සඳහන් ආකාරයට විශේෂ සම්මානයන් ප්‍රදානය කෙරේ.

- විශිෂ්ටතම අංගයට හිමි සම්මානය (සැම විටම ප්‍රථම ස්ථානය සඳහා වෙන් කෙරේ.)
- හොඳම ශාස්ත්‍රීයමය ගුණාත්මක බවින් යුතු අංගයට හිමි සම්මානය.
- හොඳම නිර්මාණයට / ප්‍රතිනිර්මාණයට හිමි සම්මානය.
- හොඳම ප්‍රසාංගික අංගයට හිමි සම්මානය.

6.03 සමස්ත ලංකා තලයේදී සමූහ තරග ශීර්ෂ කාණ්ඩ වලින් වැඩිම ලකුණු ලබා ගන්නා ප්‍රසංග අංග සඳහා පහත විෂයයන් යටතේ සම්මාන ප්‍රදානය කෙරේ.

| | |
|---|---|
| • ශාස්ත්‍රීය සංගීත අංශ සඳහා | ලයනල් එදිරිසිංහ සම්මානය |
| • ජන සංගීත වාදන අංශ සඳහා | ඩබ්.බී.මකුලොලුව සම්මානය |
| • ජන සංගීත ගායන අංශ සඳහා | සී.ද.එස් කුලතිලක සම්මානය |
| • නිර්මාණ සංගීත අංශ සඳහා | සරත් දසනායක සම්මානය |
| • සංගීතමය නාට්‍ය නිර්මාණ අංශ සඳහා | එදිරිවීර සරත්චන්ද්‍ර සම්මානය |
| • සමූහ වාදන අංශ සඳහා | සෝමදාස ඇල්විටිගල සම්මානය |
| • වෙනත් ව්‍යවහාරික සංගීත ගායන අංශ සඳහා | ඩබ්.ඩී.අමරදේව සම්මානය |
| • වෙනත් ව්‍යවහාරික සංගීත වාදන අංශ සඳහා | ප්‍රේමසිරි කේමදාස සම්මානය |
| • ප්‍රාථමික අංශය සඳහා | සුනිල් සාන්ත සම්මානය |

ඊට අමතර වශයෙන් -

| | |
|---|---|
| • ඒකල තරග ශීර්ෂ වලින් වැඩිම ලකුණු ලබාගත් තරග කරුට | " සංගීත් " සම්මානය |
| • ප්‍රථම ස්ථාන තුනක් ලබා ගත් පාසල් සඳහා | ආනන්ද සමරකෝන් සම්මානය |
| • ප්‍රථම ස්ථාන තුනකට වඩා ලබා ගත් පාසල් සඳහා | "උත්තම්" සංගීත සම්මානය |

6.04 වාර්ෂික චක්‍රලේඛය මගින් නම් කරනු ලබන ඒකල තරග ශීර්ෂ වලින් ප්‍රථම ස්ථාන ජයග්‍රාහී තරග කරුවන්ට " සංගීත් අභිමානී " සම්මානය ද 5.1.1 , 5.1.2 , 5.2.1 , 5.2.2 සහ 5.2.3. සිට 5.2.12 දක්වා යන තරග ශීර්ෂ වලින් ප්‍රථම සම්මාන ජයග්‍රාහකයින් හට " සංගීත් ප්‍රවීන් " සම්මානය ද පුද කෙරේ.

6.05 **ප්‍රාථමික තරග ශීර්ෂ**

මෙවර තරගයේ ප්‍රාථමික අංශයෙන් ඒකල හා සමූහ සියලු තරග ශීර්ෂ සඳහා කලාප මට්ටමින් ප්‍රථම සහ දෙවන ස්ථාන තෝරා පළාත් තරගයට ඉදිරිපත් කරනු ලබයි. පළාත් තරග අවස්ථාවේ දී ඉදිරිපත් වන අංග අතුරින් ප්‍රථම , දෙවන සහ තෙවන ස්ථාන ලබන පාසල් සියල්ල ම සමස්ත ලංකා අවසාන තරගයට ඉදිරිපත් කරනු ලබයි. සමස්ත ලංකා අවසාන තරගයේ දී ප්‍රථම,දෙවන සහ තෙවන ලෙස ජයග්‍රහණ ලබා දීම සිදු නොවන අතර ඒ සඳහා සියලු ම පාසල් "සරස්වතී" සම්මානයෙන් පුදනු ලබයි.

6.06 **කණිෂ්ඨ තරග ශීර්ෂ (සමූහ)**

මෙවර තරගයේ කණිෂ්ඨ අංශයෙන් සියලුම සමූහ තරග ශීර්ෂ සඳහා කලාප මට්ටමින් ප්‍රථම සහ දෙවන ස්ථාන තෝරා පළාත් තරගයට ඉදිරිපත් කරනු ලබයි. පළාත් තරග අවස්ථාවේ දී ඉදිරිපත් වන අංග අතුරින් ප්‍රථම සහ දෙවන ස්ථාන ලබන පාසල් සියල්ල ම සමස්ත ලංකා අවසාන තරගයට ඉදිරිපත් කරනු ලබයි. සමස්ත ලංකා අවසාන තරග අවස්ථාවේ දී ප්‍රථම ,දෙවන ,තෙවන ,සිව්වන සහ පස්වන ස්ථාන තෝරා (6.07 හි සඳහන් ආකාරයට) සම්මාන පුදනු ලබයි.

6.07 සමස්ත තරගයෙහි (ප්‍රාථමික කොටස හැර) සමූහ තරග ශීර්ෂයන්හි පමණක්,

| | |
|---|---|
| ප්‍රථම ස්ථානය | - ස්වර්ණ සම්මානය නමින් ද, |
| දෙවන ස්ථානය | - රජත සම්මානය නමින් ද, |
| තෙවන ස්ථානය | - ලෝකඩ සම්මානය නමින් ද, |
| සිව්වන ස්ථානය | - සම්වාද් සම්මානය නමින් ද, |
| පස්වන ස්ථානය | - සාමාර්ථ සම්මානය නමින් ද, හඳුන්වනු ලැබේ. |

- මෙම තරගයට අදාළ තරග ශීර්ෂ , සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අත්සනින් යුතුව මෙම චක්‍රලේඛයට යා කර ඉදිරිපත් කරනු ලැබේ.
- තරගයට ඉදිරිපත් වන්නන් සෑම තරග අවස්ථාවකදීම සොබාධාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීමට වග විය යුතුය.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලු ම තරග කරුවන් හා අනෙකුත් පාර්ශව කරුවන් තරගයේ සෑම අවස්ථාවක දීම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් සියලු ම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. සමස්ත ලංකා මට්ටමෙහි අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශනය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් නියමිත ස්ථානයෙහි අත්සන් යොදා තරගයට ඉදිරිපත් විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැණි ව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක දී වුවද ප්‍රතිඵල ලේඛන වලින් එම විදුහල ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## 01. ප්‍රාථමික කොටස

- ප්‍රාථමික කොටසේ සියලු ම ඒකල තරග ශීර්ෂ සඳහා රජයේ පාසල් වලටද , පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වලට ද ඉදිරිපත් විය හැකිය.
- ප්‍රාථමික කොටසේ සියලුම තරග ගැහැණු , පිරිමි වශයෙන් වර්ග නොකෙරේ.

**1.1.1.** ඒකල ගායනය - (ප්‍රාථමික) ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගායනය.
(ශුද්ධ ස්වර සප්තකය ආවරණය වන පරිදි සැකසුන ස්වර ස්ථාපන ගීතයක් තෝරා ගත හැකිය)

> **1.1.1.** තරග ශීර්ෂයට අදාළ කොන්දේසි.
> - සහභාගී විය හැක්කේ 1 සහ 2 ශ්‍රේණිවල දරුවන් සඳහා පමණි.
> - පාද හතරකින් යුත් ගීතයක් ප්‍රමාණවත් වන අතර ගීතය සහ එහි ස්වර ප්‍රස්ථාරය යන දෙකම ගැයිය යුතුය.
> - සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 01 කි.
> - සහාය වාදනය සිදු කිරීමේදී හාර්මෝනියම් භාණ්ඩය පමණක් යොදාගැනීම සිදුකල යුතුය. මෙහිදී තනුව පමණක් වයමින් සහාය වාදනය සිදුකල යුතුය.
> - කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.

**1.1.2** ඒකල ගායනය - (ප්‍රාථමික)රාගධාරී ශාස්ත්‍රීය ගායනය /කාෆි රාගය/ යමන් රාගය
(යමන් රාගය හෝ කාෆි රාගය හෝ රාග දෙකින් කැමති එක් රාගයක් තෝරා ගත හැකිය)

> **1.1.2** තරග ශීර්ෂයට අදාළ කොන්දේසි.
> - සහභාගී විය හැක්කේ 3,4,5 ශ්‍රේණිවල දරුවන් සඳහා පමණි.
> - හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතුය.
> - ආරෝහණ ,අවරෝහණ හෝ ආලාප , ස්ථායි සහ අන්තරා , තානාලංකාර(දෙකක් ප්‍රමාණවත්ය) යන කොටස් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.
> - වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කල නොහැක
> - කාලය අවම විනාඩි 02 කි.උපරිම විනාඩි 03 කි.
> - සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 03 කි.
> - ඉලෙක්ට්‍රොනික් තාම්පූරාව ද යොදා ගත හැකිය.

**1.1.3** ඒකල ගායනය -(ප්‍රාථමික) ස්වතන්ත්‍ර නිර්මාණ ගී (තේමාව - පුංචි අපේ ගුරුතුමී)
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිමය 5 කි.

**1.1.4** සමූහ ගායනය -(ප්‍රාථමික) ස්වතන්ත්‍ර නිර්මාණ ගී (තේමාව- සින්දු කියන කුරුල්ලෝ)
- සංඛ්‍යාව - වාදක මඩුල්ල හැර අවම 15 කි. වාදක මඩුල්ල සමග උපරිම 25 කි.

> ඉහත 1.1.3 හා 1.1.4 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි
>
> - සිංහල බසින් රචනා විය යුතුය.
> - තේමාව ප්‍රකට වන පරිදි ගීතයේ පද මාලාව හා නාද මාලාව සැකසී තිබිය යුතු වන අතර ප්‍රාථමික අංශයට ගැලපෙන නවතම නිර්මාණයක් විය යුතුය.
> - උචිත පරිදි ගායනයට බාධා නොවන සේ ප්‍රකාශනාත්මක චලන යොදා ගත හැකිය.
> - කාලය අවම විනාඩි 02කි.උපරිම විනාඩි 4 කි.
> - වාදක මණ්ඩලයට ගායනයට සහභාගී විය නොහැකිය.
> - පද රචනාව සහ තනුව තේමාවට ගැලපෙන පරිදි නිර්මාණාත්මක ව සකසා ගත හැකිය.

**1.1.5.** සමූහ ගායනය -(ප්‍රාථමික) ජන ගී

- මේ සඳහා කළගෙඩි , ලී කෙළි සහ එවැනි කැම - ගීත පමණක් අදාළ කර ගත යුතුය

**1.1.6.** සමූහ ගායනය -(ප්‍රාථමික)ජන ගී

- මේ සඳහා ඔළිඳ කෙළිය , මෙවර කෙළිය සහ එවැනි කැම - ගීත පමණක් අදාළ කර ගත යුතුය
- සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි

ඉහත 1.1.5 හා 1.1.6 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- ඉහත කෙළි ගී අතුරින් කිහිපයක් මිශ්‍ර කර ඉදිරිපත් කළ හැකි ය.
- සම්ප්‍රදායික නාද මාලාවලින් බැහැර නොවිය යුතුය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැකිය.
- උචිත පරිදි සමූහ ගායන අංග යොදා විචිත්‍රවත් කල හැකිය.
- ජන ගී ආර රැකෙන පරිදි විද්‍යුත් නොවන සංගීත භාණ්ඩයන් යොදා ගනිමින් සංගීත සංයෝජනය කල හැකිය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව වාදක මඩුල්ල හැර අවමය 15 කි.වාදක මඩුල්ල සමග උපරිමය 25 කි.
- කාලය අවම විනාඩි 02 කි උපරිම විනාඩි 04 කි.

**1.1.7** සමූහ ගායනය (ප්‍රාථමික) ළමා ගී (මේ සඳහා ඉදිරිපත් විය හැක්කේ 1 සිට 5 දක්වා පන්ති පැවැත්වෙන ප්‍රාථමික අංශය සඳහා වෙන්වූ පාසල් සඳහා පමණි)

- පහත එක් ගීතයක් පමණක් තෝරා ගත යුතුය.
  අකුරු මැකී නෑ කොල ගැලවී නෑ , මොනවද අම්මේ අකුරු ජාතියක් මල්පෙතිවල කවදෝ ලියලා
  මගෙ පොඩි යාලු නෙලුම්ද ඕලූ , ආදරේ ඇයි පොඩි හඳ මාමේ ඔබට මෙතරම් දරුවෝ
  හිනැහේවී බෝනික්කා ඇස් නටවා බල බලා , රුං රුං හඬ දීලා හොඳම තැනක් බලලා

- තෝරා ගත් ගීතය පෙර වාදන, අතුරු වාදන, වෙනත් ශිල්පාංග සමග මුල් නාද මාලාවට හානි නොවන පරිදි සමූහ ගායන/ වාදන අංගවලින් විචිත්‍ර කළ හැක.
- උචිත පරිදි ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැක.
- කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී වියහැකි සංඛ්‍යාව : වාදක මඩුල්ල හැර අවම 10 කි. වාදක මඩුල්ල සමග උපරිමය 15 කි

**1.2.1.** ඒකල වාදනය (ප්‍රාථමික) ගී අනුවාදනය.
(සුදත් දේවප්‍රිය මහතා අධ්‍යක්ෂණය කල , ආනන්ද ගමගේ මහතා විසින් සංගීත නිර්මාණය කල " අඹ යහළුවෝ "ටෙලි නාට්‍යයේ එන ගීත අතරින් කැමති ගීතයක් වාදනය කල යුතුය.)

ඉහත 1.2.1 ශීර්ෂයට අදාළ පොදු කොන්දේසි

- සහභාගී විය හැක්කේ 1 සහ 2 ශ්‍රේණිවල දරුවන් සඳහා පමණි.
- වයලින් , බටනලා , සිතාර් , එස්රාජ් , දිල්රුබා , ගිටාර් , සහ මැන්ඩලින් යන සංගීත භාණ්ඩ අතරින් කැමති එක් භාණ්ඩයක් වාදනය කල යුතුය.
- තෝරාගත් සංගීත භාණ්ඩය වාදනයේදී නිවැරදි ඉරියව් සහ හස්තසාධනය පිළිබඳ සුවිශේෂී අවධානය යොමුකල යුතුය.
- සහාය වාදනය සඳහා උචිත එක් කාල වාද්‍ය භාණ්ඩයක් පමණක් යොදා ගත යුතුය.
- කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න

1.2.2. ඒකල වාදනය (ප්‍රාථමික) රාගධාරී ශාස්ත්‍රීය වාදන - වයලින්

1.2.3. ඒකල වාදනය (ප්‍රාථමික) රාගධාරී ශාස්ත්‍රීය වාදන - බටනළා

1.2.4. ඒකල වාදනය (ප්‍රාථමික) රාගධාරී ශාස්ත්‍රීය වාදන - එස්රාජ්

1.2.5 ඒකල වාදනය (ප්‍රාථමික) රාගධාරී ශාස්ත්‍රීය වාදන - සිතාර්

1.2.6 ඒකල වාදනය (ප්‍රාථමික) රාගධාරී ශාස්ත්‍රීය වාදන - දිල්රුබා

- යමන් ,කාෆි ,භූපාලි ,යන රාගයන්ගෙන් කැමති එක් රාගයක් තෝරා ගත හැකිය.

ඉහත ,1.2.2. , 1.2.3. , 1.2.4 ,1.2.5. සහ 1.2.6 ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි
- සහභාගී විය හැක්කේ 3, 4, 5, ශ්‍රේණිවල දරුවන්ට පමණි.
- මධ්‍යලය වාදිතයක් , ආරෝහණ අවරෝහණ හෝ ආලාප , ස්ථායි , අන්තරා , තානාලංකාර (තුනක් පමණක් ප්‍රමාණවත්ය) ආදී ශිල්පාංග ඇතුලත්ව ඉදිරිපත් කිරිම අපේක්ෂා කෙරේ.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව අවශ්‍යනම් යොදා ගත හැකිය.
- කාලය විනාඩි 03 ත් 04 ත් අතර විය යුතුය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව- තරගකරු හැර සහාය වාදකයින් උපරිම 02 කි.

1.2.7 ඒකල වාදනය-(ප්‍රාථමික)/ශාස්ත්‍රීය තබ්ලා වාදනය (තාලය - ත්‍රිතාල්)

ඉහත 1.2.7 තරග ශිර්ෂයට අදාළ කොන්දේසි

- මධ්‍යලය වාදනයක් විය යුතුය. වයනු ලබන ලෙහෙරාවකට අනුගත විය යුතුය.
- ඨේකාව සමග කායදා, පල්ටා ,තිහායි ආදී තබ්ලා වාදන අංග ඇතුලත් වාදනයක් අපේක්ෂා කෙරේ.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය විනාඩි 02 ත් 03 ත් අතර විය යුතුය.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 02 කි.

1.2.8. සමූහ වාදනය -(ප්‍රාථමික) ප්‍රාථමික පංති වල ළමුන් සඳහා සුදුසු ප්‍රචලිත ගීතයක් - අනුවාදනය

1.2.9. සමූහ වාදනය -(ප්‍රාථමික) ප්‍රාථමික පංති වල ළමුන් සඳහා සුදුසු ප්‍රචලිත ගීතයක් - අනුවාදනය
- සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි

ඉහත 1.2.8 සහ 1.2.9 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- තැන තැන රවුමට ඉඳගෙන , ඉරෙන් හඳෙන් එළිය අරන් සහ හිංචි පිංචි හාවා යද්දි තනිවෙලා යන ගීත අතරින් එක් ගීතයක් පමණක් තෝරා ගත යුතුය.
- වාද්‍ය භාණ්ඩ තෝරා ගැනීමේ දී එක් වර්ගයකින් උපරිම වාද්‍ය භාණ්ඩ හතරකට සීමාවන පරිදි භාණ්ඩ සංයුතිය සකසා ගත යුතු ය .
- තෝරා ගත් ගීතයේ මුල් නාද මාලාව එලෙසින් ම ආරක්ෂා විය යුතු ය.
- ඕනෑම ශෛලියක් හෝ ශිල්ප ක්‍රමයක් යොදා ගත හැකි ය.
- විද්‍යුත් නොවන සහ ආදේශක නොවන සම්මත සංගීත භාණ්ඩ යොදා ගත හැකි අතර කටහඬ භාවිතා කල නොහැක.(දඩුබෙරය යොදා ගත හැකිය.)
- කාලය අවම විනාඩි 02 කි.උපරිම විනාඩි 04 කි.සහභාගී විය හැකි සංඛ්‍යාව - වාදක මණ්ඩලය (හඬුරවන්නා ද ඇතුළුව) අවමය 12 කි. උපරිමය 15 කි.

## 02.කණිෂ්ඨ කොටස

2.1.1. ඒකල ගායනය - (කණිෂ්ඨ)/ගැහැණු /රාගධාරී/බිලාවල් රාගය

2.1.2. ඒකල ගායනය - (කණිෂ්ඨ)/පිරිමි /රාගධාරී/කාෆි රාගය

2.1.3. ඒකල ගායනය - (කණිෂ්ඨ)/ගැහැණු /රාගධාරී/භූපාලි රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ 3 වර්ගයේ සහ 1 c වර්ගයේ පාසල්වලට පමණි)

2.1.4. ඒකල ගායනය - (කණිෂ්ඨ)/පිරිමි /රාගධාරී/යමන් රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ 3 වර්ගයේ සහ 1 c වර්ගයේ පාසල්වලට පමණි)

**2.1.1 සිට 2.1.4 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතුය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය ගායනා අංග වලින් පෝෂිත විය යුතුය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කල නොහැක
- කාලය අවම විනාඩි 04 කි.උපරිම විනාඩි 06කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම අංඛ්‍යාව 04 කි.
- ඉලෙක්ට්‍රොනික් තාම්පුරාව ද යොදා ගත හැකිය.

2.1.5. ඒකල ගායනය - (කණිෂ්ඨ)/ගැහැණු / නූර්ති (සෝබමාන දේව පුරා , ලෝනා මුණි රාජගේ)

2.1.6. ඒකල ගායනය-(කණිෂ්ඨ) /පිරිමි / නාඩගම් - (ගම්බිර තෙදැති , ලෝ පසිඳු)

**ඉහත 2.1.5 සහ 2.1.6 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- අදාළ නූර්ති /නාඩගම් ගී අතුරින් කැමති ගීයක් තෝරා ගත හැකිය.
- අදාළ ගීය අයත් ශෛලියට අනුකූලව ගායන,වාදන,අංග වලින් පෝෂිත විය යුතුය.
- ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය.
- ගී ශෛලිය,ආකෘතිය රැකෙන පරිදි, මුල් නාද මාලාව අනුව ගායනය කළ යුතුය.
- කාලය - ගීතයට අදාල කාලය ලෙස සලකන්න.
- සහභාගීවිය හැකි සංඛ්‍යාව- තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05 කි.

2.1.7 සමූහ ගායනය - (කනිෂ්ඨ) /ගැහැණු / සරල ගී
2.1.8 සමූහ ගායනය - (කනිෂ්ඨ) / පිරිමි / සරල ගී
2.1.9 සමූහ ගායනය - (කනිෂ්ඨ) / මිශ්‍ර / සරල ගී

2.1.10 සමූහ ගායනය - (කනිෂ්ඨ) /පොදු / සරල ගී(සහභාගි විය හැක්කේ සිසු සංඛ්‍යාව 500 ට අඩු පාසල්වලට පමණි. ගැහැණු/පිරිමි/මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).

2.1.11 සමූහ ගායනය - (කනිෂ්ඨ) /පොදු / සරල ගී(සහභාගි විය හැක්කේ සිසු සංඛ්‍යාව 501 -1000 ත් අතර පාසල්වලට පමණි. ගැහැණු/පිරිමි/මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).

<u>පහත එක් ගීතයක් පමණක් තෝරා ගත යුතුය.</u>

- නිවහල් සිතුවිලි සිතනා - පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව
- පාවී පාවී මේ එන්නේ - ප්‍රවීන ගායන ශිල්පී වී.එම් ජයරත්න
- රන් දහදිය බිංදු බිංදු - පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව
- ශ්‍රීඝණධරිත ස්වර්ණ භූමියයි - ප්‍රවීන ගායන ශිල්පිනී ලතා වල්පොල
- මේ අපේ මාතෘ භූමියයි - ප්‍රවීන ගායන ශිල්පිනියන් වන ලාලනී සෝමසිරි සහ අමිතා වැදිසිංහ
- අරුණු රැසක් රැසක් රැසක් - ආචාර්ය වික්ටර් රත්නායක

**2.1.7 සිට 2.1.11. දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් ශීර්ෂයකට පමණි.
- කෝරා ගත් ගීතය පෙර වාදන, අතුරු වාදන, වෙනත් ශිල්පාංග සමග මුල් නාද මාලාවට හානි නොවන පරිදි සමූහ ගායන/ වාදන අංගවලින් විචිත්‍ර කළ හැක.
- උචිත පරිදි ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැක.
- කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
  සහභාගී වියහැකි සංඛ්‍යාව : වාදක මඩුල්ල හැර අවම 12 කි. වාදක මඩුල්ල සමග උපරිමය 20 කි.

**2.1.12** සමූහ ගායනය-(කනිෂ්ඨ) /ගැහැණු /ළමා ගී-නව නිර්මාණ (නව ලොවකට නව නිපැයුම්)

**2.1.13** සමූහ ගායනය-(කනිෂ්ඨ) /පිරිමි/ළමා ගී - නව නිර්මාණ (අතීතයෙන් නැවුම් ලොවක්)

**2.1.14** සමූහ ගායනය -(කනිෂ්ඨ) /මිශ්‍ර/ළමා ගී - නව නිර්මාණ (විද්‍යා දැනුමෙන් ලොවක් තනමු)

**2.1.12 සිට 2.1.14. දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් තරග ශීර්ෂයකට පමණි.
- තේමාවේ දැක්වෙන අදහස් මතුකරමින් ,අධ්‍යාපනික වටිනාකමකින් යුත් නවතම පද මාලාවකට නවතම තනුවක් යොදා ගායනා කළ යුතු අතර ඕනෑම සංගීත ශෛලියක් භාවිතා කළ හැකි ය. උචිත පරිදි ප්‍රකාශනාත්මක චලන යොදා ගත හැක. පෙර/අතුරු වාදන ඇතුළු සරල සංගීතයේ භාවිතා වන ශිල්පාංග යොදා ගත හැකිය.
- කාලය අවමය විනාඩි 3කි.උපරිම විනාඩි 5කි.
- සහභාගී වියහැකි සංඛ්‍යාව: වාදක මඩුල්ල හැර අවම 15කි.වාදක මඩුල්ල සමග උපරිම 25 කි.

**2.1.15** සමූහ ගායනය - (කනිෂ්ඨ) ගැහැණු/ජන ගී

**2.1.16** සමූහ ගායනය - (කනිෂ්ඨ) පිරිමි/ජන ගී

**2.1.17** සමූහ ගායනය - (කනිෂ්ඨ) මිශ්‍ර/ජන ගී

**2.1.18** සමූහ ගායනය - (කනිෂ්ඨ) පොදු/ජන ගී

**2.1.19** සමූහ ගායනය - (කනිෂ්ඨ) පොදු/ජන ගී

**2.1.20** සමූහ ගායනය - (කනිෂ්ඨ) පොදු/ජන ගී

**2.1.21** සමූහ ගායනය - (කනිෂ්ඨ) පොදු/ජන ගී

- (2.1.15, 2.1.16, 2.1.17, 2.1.18, 2.1.19 ,2.1.20 , 2.1.21 යන තරග ශීර්ෂ සඳහා (ලී කෙළි/ ඔළිඳ කෙළිය /රබන් ගීත) යන ගී අතුරින් කිහිපයක් මිශ්‍ර කර ඉදිරිපත් කළ හැකි ය).
- 2.1.18.සඳහා සහභාගි විය හැක්කේ 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල්වලට පමණි.
  (එය ගැහැණු පිරිමි හෝ මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).
- 2.1.19. සඳහා සහභාගි විය හැක්කේ සිසු සංඛ්‍යාව 500 ට අඩු පාසල්වලට පමණි.
  (එය ගැහැණු / පිරිමි හෝ මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).
- 2.1.20. සඳහා සහභාගි විය හැක්කේ පෞද්ගලික සහ ජාත්‍යන්තර පාසල් සඳහා පමණි.)
  (එය ගැහැණු / පිරිමි හෝ මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).
- 2.1.21 සඳහා සහභාගි විය හැක්කේ සිසු සංඛ්‍යාව 501 -1000 ත් අතර පාසල්වලට පමණි.
  (එය ගැහැණු / පිරිමි / මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).

**2.1.15 සිට 2.1.21 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් ශීර්ෂයක් සඳහා පමණි.
- සාම්ප්‍රදායික නාද මාලාවලින් බැහැර නොවිය යුතුය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැකිය.
- උචිත පරිදි සමූහ ගායන අංග යොදා විචිත්‍රවත් කල හැකියි.
- ජන ගී ආර රැකෙන පරිදි විද්‍යුත් නොවන සංගීත භාණ්ඩයන් යොදා ගනිමින් සංගීත සංයෝජනය කල හැකියි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව :වාදක මඩුල්ල හැර අවමය 15 කි. වාදක මඩුල්ල සමග උපරිමය 25 කි.
- කාලය අවම විනාඩි 03 කි උපරිම විනාඩි 05 කි.
- දඩුබෙරය යොදාගත හැක.

2.2.1 ඒකල වාදනය - (කනිෂ්ඨ)/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

2.2.2 ඒකල වාදනය - (කනිෂ්ඨ)/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - භෛරවී රාගය

2.2.3 ඒකල වාදනය - (කනිෂ්ඨ)/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

2.2.4 ඒකල වාදනය - (කනිෂ්ඨ)/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භූපාලි රාගය

2.2.5 ඒකල වාදනය - (කනිෂ්ඨ)/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

2.2.6 ඒකල වාදනය - (කනිෂ්ඨ)/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - කාෆි රාගය

2.2.7 ඒකල වාදනය - (කනිෂ්ඨ)/ගැහැණු/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

2.2.8 ඒකල වාදනය - (කනිෂ්ඨ)/පිරිමි/රාගධාරී/දිල්රුබා/නියමිත රාගය - යමන් රාගය

2.2.9 ඒකල වාදනය - (කනිෂ්ඨ)/ගැහැණු/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල් රාගය

2.2.10 ඒකල වාදනය - (කනිෂ්ඨ)/පිරිමි/රාගධාරී/සිතාර්/නියමිත රාගය - බිලාවල් රාගය

ඉහත 2.2.1 සිට 2.2.10 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- මධ්‍යලය වාදනයක් විය යුතුය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 04 කි. උපරිම විනාඩි 06කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව: තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03කි.

2.2.11. ඒකල වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

2.2.12. ඒකල වාදනය-(කනිෂ්ඨ)/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්

2.2.13. ඒකල වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ සහ 3 වර්ගයේ සහ 1 C වර්ගයේ පාසල්වලට පමණි).

2.2.14. ඒකල වාදනය-(කනිෂ්ඨ)/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ සහ 3 වර්ගයේ සහ 1 C වර්ගයේ පාසල්වලට පමණි).

2.2.15 ඒකල වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
( • සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි ).

2.2.16 ඒකල වාදනය-(කනිෂ්ඨ)/පිරිමි/තබ්ලා/ නියමිත තාලය - ත්‍රිතාල්
( • සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි ).

ඉහත 2.2.11 සිට 2.2.16 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- මධ්‍යලය වාදනයක් විය යුතුය.ලෙහෙරාවකට අනුගත විය යුතුය.
- ශාස්ත්‍රිය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ සාම්ප්‍රදායික,පිළිවෙලින් ඉදිරිපත් කළ යුතුය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 03කි.උපරිම විනාඩි 05කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - කරහකරු හැර සහාය වාදකයින් උපරිම 02 කි.

2.2.17 ඒකල වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/ගී අනුවාදන-හාර්මෝනියම්/මහ බෝධි මුලේ විදුරසුනේ ($C^m$)

2.2.18 ඒකල වාදනය-(කනිෂ්ඨ)/පිරිමි/ගී අනුවාදන-හාර්මෝනියම්/ සිරි බුද්ධගයා විහාරේ ($E^b$)

2.2.19. ඒකල වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/ගී අනුවාදන-හාර්මෝනියම්/ කවාලා විළඳ ජාති ($D^m$)
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ ,3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

2.2.20. ඒකල වාදනය-(කනිෂ්ඨ)/පිරිමි/ගී අනුවාදන-හාර්මෝනියම්/ සංසාරේ භවේ දුකා ($F^m$)
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

2.2.17 සිට 2.2.20. දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි.

- ගීතය ඉදිරියේ දී ඇති ස්කේලයම (scale) පාදක කරගත යුතුය.
- සහාය වාදනය සඳහා තබ්ලාව පමණක් යොදා ගත යුතුය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව-02 කි.
- කාලය - නියමිත ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.

2.2.21. සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/ගැහැණු/ ලතා වල්පොල ශිල්පිනිය ගැයූ - "පෙරදිග මුතුඇටයයි මේ" ගීතය.

2.2.22. සමූහ ගී අනු වාදනය - (කනිෂ්ඨ) /පිරිමි/ අයිවෝ ඩෙනිස් ශූරීන් ගැයූ - "අභිමානනීය වූ නවෝදයේ "ගීතය.

2.2.23. සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/මිශ්‍ර/ ආචාර්ය වික්ටර් රත්නායකයන් ගැයූ - "රුවන් නිදන හෙළබිමයි"ගීතය.

2.2.24. සමූහ ගී අනුවාදනය-(කනිෂ්ඨ)/පොදු/ පණ්ඩිත් අමරදේවයන් ගැයූ "රත්න දීප ජන්ම භූමි "ගීතය.
සහභාගි විය හැක්කේ 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල්වලට පමණි.
(ගැහැණු / පිරිමි / මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ.)

2.2.25. සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/පොදු/ " ලෝකෙන් උතුම් රට ලංකාවයි -ලංකාවයි සිරි ලංකාවයි "ගීතය.
සහභාගි විය හැක්කේ ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට අඩු පාසල්වලට පමණි.
(ගැහැණු / පිරිමි / මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ.)

2.2.26 සමූහ ගී අනු වාදනය-(කනිෂ්ඨ)/පොදු/ විශාරද එඩ්වඩ් ජයකොඩි ශූරීන් ගැයූ "නිදහස් නිවහල් ලංකා " ගීතය.
සහභාගි විය හැක්කේ සිසු සංඛ්‍යාව 501 -1000 ක් අතර පාසල්වලට පමණි.
(ගැහැණු / පිරිමි / මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).

2.2.21. සිට 2.2.26 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- එක් පාසලකට සහභාගී විය හැක්කේ මින් එක් ශිර්ෂයකට පමණි.
- සංඛ්‍යාව - වාදක මණ්ඩලය (හසුරුවන්නා ද ඇතුළුව) අවම 15කි.උපරිම 20 කි.
- කාලය-අදාල ගීතයට නියමිත කාලය ලෙස සලකන්න.
- එක් වාදකයෙකුට වාද්‍ය භාණ්ඩ කිහිපයක් වුවද වාදනය කළ හැකිය. ආදේශ භාණ්ඩ,විද්‍යුත් භාණ්ඩ සහ පියානෝව හැර ඕනෑම සංගීත භාණ්ඩයක් භාවිකා කළ හැකි ය.එමෙන්ම කටහඬ භාවිත කළ නොහැක.
- දඹුබෙරය යොදාගත හැකිය.

03.1 ජේෂ්ඨ - 1 කොටස (9-13 ශ්‍රේණිවල සිසුන් සඳහා)

3.1.1.1 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/ගැහැණු/රාගධාරි/ධෘපද් ශෛලිය/කාෆි රාගය

3.1.1.2 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/පිරිමි/රාගධාරි/ තරානා ශෛලිය/මාල්කෞන්ස් රාගය

3.1.1.3 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/මිශ්‍ර/රාගධාරි/ චතුරංග ශෛලිය/භෛරවී රාගය

3.1.1.4 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/ගැහැණු/රාගධාරි/ ඛ්‍යාල්(මධ්‍යලය) /බාගේශ්‍රී රාගය

3.1.1.5 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/පිරිමි/රාගධාරි/ ඛ්‍යාල්(මධ්‍යලය)/බිහාග් රාගය

3.1.1.6 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/මිශ්‍ර/රාගධාරි/ ඛ්‍යාල්(මධ්‍යලය)/දේස් රාගය

(ඉහත ශිර්ෂ තුනට සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.1.1.1 සිට 3.1.1.6 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් තරග ශිර්ෂයකට පමණි.
- හින්දි බසින්,බෝල් පද ආදියෙන් රචිත අදාල ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතුය.
- නියමිත ශෛලියට අදාල සාම්ප්‍රදායික ගායන අංග,හින්දුස්ථානී රාගධාරි අංග මෙන් ම සමූහ ගායන අංග ද උචිත පරිදි යොදා විචිත්‍ර කළ හැකිය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- ශාස්ත්‍රීය පදනම ආරක්ෂා විය යුතු අතර රාග සංගති නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.
- සහාය වාද්‍ය භාණ්ඩ භාවිතයේ දී සාම්ප්‍රදායික සහාය වාදන පිළිවෙලට අනුකූල විය යුතු ය.
- කාලය අවම විනාඩි 05කි.උපරිම විනාඩි 07කි.
- සංඛ්‍යාව - වාදක මඩුල්ල හැර අවම 15කි.වාදක මඩුල්ල සමග උපරිම 25 කි.
- තාම්පුරා සහ ස්වර මණ්ඩල පමණක් , වයමින් ගායනයේ යෙදිය හැකිය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.

3.1.1.7 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/ගැහැණු/ජන ගී/ශාන්තිකර්ම ගී - (උඩරට, පහතරට, සබරගමු)

3.1.1.8 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/පිරිමි/ජන ගී/ ශාන්තිකර්ම ගී - (උඩරට, පහතරට, සබරගමු)

3.1.1.9 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/මිශ්‍ර/ජන ගී/ ශාන්තිකර්ම ගී - (උඩරට, පහතරට, සබරගමු)

(ඉහත ශිර්ෂ තුනට සහභාගී විය හැක්කේ 2 වර්ගයේ ,3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.1.1.10 සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/ පොදු /ජන ගී/ ශාන්තිකර්ම ගී - (උඩරට, පහතරට, සබරගමු)

සහභාගී විය හැක්කේ සිසු සංඛ්‍යාව 501 -1000 ක් අතර පාසල්වලට පමණි.
(ගැහැණු / පිරිමි/ මිශ්‍ර වශයෙන් වර්ගීකරණයට ලක් නොවේ).

- සාම්ප්‍රදායික නාද මාලාවලින් බැහැර නොවිය යුතුය.
- උඩරට ශාන්තිකර්ම /පහතරට ශාන්තිකර්ම /සබරගමු ශාන්තිකර්ම ගී මිශ්‍ර ව යොදා ගනිමින් ගැලපෙන ලෙස ඉදිරිපත් කළ යුතුය.

**3.1.1.11** සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/ගැහැණු/ජන ගී ආශ්‍රිත නව නිර්මාණ

**3.1.1.12** සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/පිරිමි/ජන ගී ආශ්‍රිත නව නිර්මාණ

**3.1.1.13** සමූහ ගායනය-(ජ්‍යෙෂ්ඨ-1)/මිශ්‍ර/ජන ගී ආශ්‍රිත නව නිර්මාණ

- 3.1.1.11 , 3.1.1.12 , 3.1.1.13 යන ශිර්ෂයන් 3 සඳහා ම " සශ්‍රීකත්වය "යන තේමාව යටතේ ඉදිරිපත් කළ යුතු ය.

- තේමාවට අදාළ ව ගැමි සංස්කෘතිය පිළිබිඹු වන අයුරින් රචිත නවකම පද මාලාවකට,සාම්ප්‍රදායික ජන සංගීත ශෛලිය සහ ගති ලක්ෂණ ඉස්මතු වන පරිදි නවතම තනුවක් යෙදූ ගී නිර්මාණයක් විය යුතුය.පෙරදිග හා අපරදිග සංගීත ශිල්පක්‍රම භාවිත කළ හැක.

ඉහත 3.1.1.7 සිට 3.1.1.13 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මින් එක් තරඟ ශිර්ෂයකට ය.
- ගායනයට බාධා නොවන සේ උචිත පරිදි ප්‍රකාශනාත්මක අංග චලන යොදා ගත හැක.
- විද්‍යුත්/ආදේශ භාණ්ඩ හා පියානෝව හැර වෙනත් ඕනෑම වාද්‍ය භාණ්ඩයක් ජන සංගීත ශෛලිය රැකෙන සේ උචිත පරිදි යොදා ගත හැක.
- ගායනයට හානි නොවන සේ උචිත පරිදි සමූහ ගායන අංග යොදා විචිත්‍රවත් කළ හැක.
- ජන ගී ආර රැකෙන සේ සංගීත සංයෝජනය කළ යුතු ය.
- කාලය අවම විනාඩි 04 කි.උපරිම විනාඩි 06කි.
- සහභාගී වියහැකි සංඛ්‍යාව:වාදක මඩුල්ල හැර අවම 15කි.වාදක මඩුල්ල සමග උපරිම 25 කි.
- දඬුබෙරය යොදා ගත හැක.

**3.1.2.1.** සමූහ වාදනය - (ජ්‍යෙෂ්ඨ-1)/ගැහැණු / නාද වෘන්ද (ගායනය / වාදනය)

**3.1.2.2.** සමූහ වාදනය - (ජ්‍යෙෂ්ඨ-1) / පිරිමි / නාද වෘන්ද (ගායනය / වාදනය)

**3.1.2.3.** සමූහ වාදනය - (ජ්‍යෙෂ්ඨ-1) /මිශ්‍ර / නාද වෘන්ද (ගායනය / වාදනය)

- නාද , කාල , භාව ප්‍රකට වන නිර්මාණාත්මක ගායන / වාදන විය යුතුය.
- ගායකයින් හා වාදකයින් 12 දෙනෙකු එකතු වී වේදිකාව මත කරනු ලබන නව නිර්මාණයක්

ඉහත 3.1.2.1 සිට 3.1.2.3 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- ගායනයට 06 දෙනෙකු සහ වාදනයට 06 දෙනෙකු සහභාගී විය යුතුය.
- ගායනයේදී කටහඬ සහ විවිධ කටහඬ ප්‍රයෝග පමණක් භාවිත කළ හැකිය.
- වාදනය සඳහා විද්‍යුත් නොවන සංගීත භාණ්ඩ භාවිත කළ හැකි අතර විදුලි ඕගනයෙන් පියානෝවේ හඬ පමණක් භාවිත කළ හැක.
- විදුලි ඕගනය භාවිතයේදී පෙර සකසන ලද සංගීත පථ (Recorded Music Tracks) භාවිත කළ නොහැක.
- එක් වාදකයකුට විවිධ භාණ්ඩ කිහිපයක් වුවද වාදනය කළ හැක.
- කණ්ඩායමේ කිසිවකුට ගායනය /වාදනය හැර ශරීරයට තට්ටු කරමින් උපදවන නාද (Body Percussion) භාවිත කළ නොහැක.
- ව්‍යාවහාරික සංගීත ශිල්ප ක්‍රම ද උචිත ආකාරයෙන් යොදා ගත හැකියි.
- නිර්මාණාත්මක බව, ශිල්පීය දක්ෂතා සහ ප්‍රසංගාත්මක බව අපේක්ෂා කෙරේ.
- කාලය: අවම විනාඩි 04 කි.උපරිම 06 කි.

## 03.2 ජ්‍යෙෂ්ඨ-2 කොටස (9 -11 ශ්‍රේණිවල සිසුන් සඳහා)

3.2.1.1 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/ යමන් රාගය

3.2.1.2 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/ භූපාලි රාගය

3.2.1.3 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/ කාෆි රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.2.1.4 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/භෛරවී රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

**3.2.1.1 සිට 3.2.1.4 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- හින්දි බසින් රචිත ඛ්‍යාල් ශෛලියේ මධ්‍යලය ගීතයක් විය යුතුය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කළ නොහැක.
- කාලය අවම විනාඩි 05කි.උපරිම විනාඩි 07කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව භාවිත කළ හැකි ය.

3.2.1.5 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/භජන් ගායන ශෛලිය

3.2.1.6 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/කව්වාලි ගායන ශෛලිය

**3.2.1.5 සිට 3.2.1.6 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- නියමිත ගායන විශේෂයට අදාලව කැමති එක් ගීතයක් තෝරාගත යුතුය.
- අදාල ගීය අයත් ශෛලියට අනුකූල ගායන හා වාදන අංගවලින් පෝෂිත විය යුතුය.
- කාලය ගීතයට ගතවන කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05කි.
- ප්‍රාසාංගිකව ඉදිරිපත් කළ යුතුය.

3.2.1.7 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/සරල ගී

3.2.1.8 ඒකල ගායනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/සරල ගී

**3.2.1.7 සිට 3.2.1.8 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

නිර්දේශිත ගීත-(පහත එක් ගීතයක් පමණක් තෝරා ගත යුතුයි)

- මයුරාසන හිඳ පාන තෙදැති - ප්‍රවීන ගායන ශිල්පී සුනිල් එදිරිසිංහ
- නිදුකානනේ - ප්‍රවීන ගායන ශිල්පී සුනිල් එදිරිසිංහ
- වාරු දේහේ නුරා මා දැසේ මැවේ - ප්‍රවීන ගායන ශිල්පී අමරසිරි පීරිස්
- මාතා මාතා මා ප්‍රියාදර ජයභූමී - ප්‍රවීන ගායන ශිල්පිනී ලතා වල්පොල
- ජීවන විලමැද වැජබෙන කැකුලකි - ප්‍රවීන ගායන ශිල්පිනී සුජාතා අත්තනායක
- කිත්සිරි රන්දූ ලක්දද බැන්දූ - ප්‍රවීන ගායන ශිල්පිනී ලතා වල්පොල
- සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර වාදකයින් උපරිම සංඛ්‍යාව 06 කි.
- කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න.

3.2..2.1 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - කාෆි රාගය

3.2.2.2 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - කාෆි රාගය

3.2.2.3 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භෛරවී රාගය

3.2.2.4 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භෛරවී රාගය

3.2.2.5 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - භිම්පලාසි රාගය

3.2.2.6 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය: - භිම්පලාසි රාගය

3.2.2.7 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - බිලාවල් රාගය

3.2.2.8 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - බිලාවල් රාගය

3.2.2.9 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - භූපාලි රාගය

3.2.2.10 ඒකල වාදනය - ( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - භූපාලි රාගය

**3.2.2.1 සිට 3.2.2.10 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- මධ්‍යලය ශාස්ත්‍රීය වාදනයක් විය යුතුය.
- සාම්ප්‍රදායික ඒකල ශාස්ත්‍රීය වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය: අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව: තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03කි.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.

3.2.2.11 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරි ධුන්/ගිටාර් - ආශ්‍රිත රාගය - මිශ්‍ර කාෆි රාගය

3.2.2.12 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරි ධුන්/ගිටාර් - ආශ්‍රිත රාගය - මිශ්‍ර භෛරවී රාගය

3.2.2.13 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/රාගධාරි ධුන්/මැන්ඩලින්-ආශ්‍රිත රාගය - දේශ් රාගය

3.2.2.14 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/රාගධාරි ධුන්/මැන්ඩලින්-ආශ්‍රිත රාගය - ඛමාජ් රාගය

**3.2.2.11 හා 3.2.2.14 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- ධුන් ශෛලියට උචිතව වාදනය ඉදිරිපත් කල යුතුය.
- සහාය වාදනය සදහා තබ්ලාව සහ ශ්‍රැති භාණ්ඩයක් යොදා ගත හැකි ය.(සහාය වාදනය සඳහා උපරිම 02 කි).
- කාලය විනාඩි 03 - 05 දක්වා වේ.

3.2.2.15 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්

3.2.2.16 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්

3.2.2.17 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.2.2.18 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.2.2.19 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්
(සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි).

3.2.2.20 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/තබ්ලා/නියමිත තාලය - ත්‍රී තාල්
(සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලට පමණි).

| |
|---|
| **3.2.2.15 හා 3.2.2.20 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**<br>• මධ්‍යලය වාදනයක් ඉදිරිපත් කල යුතුය. ලෙහෙරාවකට අනුගත විය යුතුය.<br>• ශාස්ත්‍රිය තබ්ලා වාදන අංග,ප්‍රබන්ධ සාම්ප්‍රදායික පිළිවෙලින් ඉදිරිපත් කළ යුතුය.<br>• වයනු ලබන ලෙහෙරාවට අනුගත විය යුතු ය.<br>• නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.<br>• කාලය අවම විනාඩි 04 කි.උපරිම විනාඩි 06කි.<br>• සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 02 කි. |

**3.2.2.21** ඒකල වාදනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/හාර්මෝනියම්/ගී-අනු වාදනය-නොබලන් කුමරිය නිසසල මා දෙස ($B^b$)

**3.2.2.22** ඒකල වාදනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/හාර්මෝනියම්/ගී-අනු වාදනය-පොඩි කුමාරි හාමිනේ ($E^b$)

**3.2.2.23** ඒකල වාදනය-(ජ්‍යෙෂ්ඨ-2)/ගැහැණු/හාර්මෝනියම්/ගී-අනු වාදනය - පූර්ණ චන්ද්‍රා ලෙසේ පායනා රාත්‍රියේ ($E^m$)
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

**3.2.2.24** ඒකල වාදනය-(ජ්‍යෙෂ්ඨ-2)/පිරිමි/හාර්මෝනියම්/ගී-අනු වාදනය-පින් මන්ද රංග භූමියේ ($D^m$)
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

| |
|---|
| **3.2.2.21 සිට 3.2.2.24 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**<br>• සහය වාදනය සදහා තබ්ලාව යොදා ගත යුතු ය.මීට අමතර වශයෙන් ගිටාරය සහය වාදනයට යොදා ගත හැකිය.<br>• සහභාගී විය හැකි සංඛ්‍යාව: තරගකරු හැර උපරිම දෙදෙනෙකු ය.<br>• කාලය: ගීතයට අදාළ කාලය ලෙස සලකන්න |

## <u>03. ජ්‍යෙෂ්ඨ - 3 කොටස (12,13 ශ්‍රේණිවල සිසුන් සඳහා)</u>

**3.3..1.1** ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/ දේස් රාගය

**3.3.1.2** ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/ හංසධ්වනි රාගය

**3.3.1.3** ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/ ආසාවරී රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

**3.3.1.4** ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/ බාගේශ්‍රී රාගය
(සහභාගී විය හැක්කේ 2 වර්ගයේ , 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

| |
|---|
| **3.3.1.1 සිට 3.3.1.4 දක්වා ශිර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**<br>• හින්දි බසින් රචිත විලම්භ සහ මධ්‍යලය ඛ්‍යාල් ගී දෙවර්ගයම ඉදිරිපත් කල යුතුය.<br>• වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කල නොහැක.<br>• සාම්ප්‍රදායික ශාස්ත්‍රිය ඒකල ගායන අංගවලින් පෝෂිත විය යුතු ය.<br>• කාලය අවම විනාඩි 08කි.උපරිම විනාඩි 10 කි.<br>• සහභාගී විය හැකි සංඛ්‍යාව - තරඟකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.<br>• ඉලෙක්ට්‍රොනික තාම්පුරාව භාවිත කළ හැකි ය.<br>• ප්‍රථම ස්ථානය සඳහා "සංගීත් අභිමානි" සම්මානය හිමි වේ. |

3.3..1.5 ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3) / ගැහැණු / ठुमरि

3.3.1.6 ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3) / පිරිමි / ගසල්

| |
|---|
| 3.3.1.5 සිට 3.3.1.6 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි<br>• අදාළ ගායන ශෛලියට අයත් එක් ගීතයක් ඉදිරිපත් කල යුතුය.<br>• එම ගායන ශෛලියට ආවේණික ගායන හා වාදන විධි වලින් පෝෂිත විය යුතුය.<br>• වෙනත් ගායන ශෛලින් මිශ්‍ර කල නොහැක.<br>• කාලය - උපරිම විනාඩි 06 කි.<br>• සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම සංඛ්‍යාව 05කි. |

3.3..1.7 ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/සරල ගී

3.3.1.8 ඒකල ගායනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/සරල ගී

| |
|---|
| 3.3.1.7 සිට 3.3.1.8 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි<br>නිර්දේශිත ගීත-(පහත එක් ගීතයක් පමණක් තෝරාගත යුතුය)<br>• Nadiya Kinaare Herai Aai Kangna - Abhimaan - **Lata mangeshkar**<br>• **Na Koi Umang Hai - Kati Patang - Lata mangeshkar**<br>• **Naina Barse Rim Jhim - . Woh Kaun Thi - Lata mangeshkar**<br>• **Baharon Phool Barsao** – Suraj - mohammad rafi<br>• **Chahunga Main Tujhe Saanjh Savere – Dosti - mohammad rafi**<br>• **Sawan Ki Ghata Chayi - Kasmir Ki Kali - mohammad rafi**<br>• මුල් ගීතයේ පද මාලාවට හා නාද මාලාවට හානි නොවන ලෙස ගැයිය යුතුය.<br>• සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර වාදකයින් උපරිම සංඛ්‍යාව 08 කි.<br>• කාලය - ගීතයට අදාළ කාලය ලෙස සලකන්න. |

3.3..2.1 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/වයලීනය/නියමිත රාගය - හංසධ්වනි රාගය

3.3.2.2 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/වයලීනය/නියමිත රාගය - හංසධ්වනි රාගය

3.3.2.3 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භීමපලාසි රාගය

3.3.2.4 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/එස්රාජ්/නියමිත රාගය - භීමපලාසි රාගය

3.3.2.5 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/බටනලා/නියමිත රාගය - බාගේශ්‍රී රාගය

3.3.2.6 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/බටනලා/නියමිත රාගය - බාගේශ්‍රී රාගය

3.3.2.7 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - මාල්කෞන්ස් රාගය

3.3.2.8 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/ සිතාර් /නියමිත රාගය - මාල්කෞන්ස් රාගය

3.3.2.9 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - දේස් රාගය

3.3.2.10 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/ දිල්රුබා /නියමිත රාගය - දේස් රාගය

3.3.2.11 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/රාගධාරී/හවායින් ගිටාර්/නියමිත රාගය -ආසාවරී රාගය

3.3.2.12 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/රාගධාරී/ හවායින් ගිටාර් /නියමිත රාගය-ආසාවරී රාගය

3.3.2.1 සිට 3.3.2.12 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- විලම්භලය සහ මධ්‍යලය හෝ ධෘතලය වාදනයක් විය යුතුය.
- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ඒකල වාදන අංගවලින් පෝෂිත විය යුතු ය.
- නිවැරදි ඉරියව් සහ හස්ත සාධන පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 10කි. උපරිම විනාඩි 12 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 03කි.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.
- ප්‍රථම ස්ථානය සඳහා "සංගීත් අභිමානි" සම්මානය හිමි වේ.

3.3.2.13 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ඒක්තාල්

3.3.2.14 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/තබ්ලා/නියමිත තාලය - රූපක් තාලය

3.3.2.15 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/ගැහැණු/තබ්ලා/නියමිත තාලය - ඒක්තාල්
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ, 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.3.2.16 ඒකල වාදනය-( ජ්‍යෙෂ්ඨ-3)/පිරිමි/තබ්ලා/නියමිත තාලය - රූපක් තාලය
(සහභාගි විය හැක්කේ 2 වර්ගයේ, 3 වර්ගයේ සහ 1-C වර්ගයේ පාසල්වලට පමණි).

3.3.2.13 සිට 3.3.2.16 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- විලම්භලය සහ මධ්‍යලය හෝ ධෘත ලය වාදනයක් විය යුතුය.
- වයනු ලබන ලෙහෙරාවට අනුගත විය යුතු ය.
- ශාස්ත්‍රීය තබ්ලා වාදන අංග හා ප්‍රබන්ධ සාම්ප්‍රදායික ලෙස ඉදිරිපත් කල යුතුය.
- නිවැරදි වාදන ඉරියව් සහ නාද නිෂ්පත්තිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.
- කාලය අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහාය වාදකයින් උපරිම 02 කි.
- ප්‍රථම ස්ථානය සඳහා "සංගීත් අභිමානි" සම්මානය හිමි වේ.

## 04. විවෘත කොටස

4.1.1 යුගල ගායනය - රාගධාරී ඛ්‍යාල් - ගැහැණු

4.1.2 යුගල ගායනය - රාගධාරී ඛ්‍යාල් - පිරිමි

4.1.3 යුගල ගායනය - රාගධාරී ඛ්‍යාල් - මිශ්‍ර

දක්වා ශීර්ෂයන් 4.1.3 සිට 4.1.1ට අදාළ පොදු කොන්දේසි

- උත්තර භාරතීය ප්‍රචලිත රාගයක් තෝරාගත යුතුය.
- හින්දි බසින් රචිත මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් විය යුතුය.
- යුගල ගායන අංග ශාස්ත්‍රීය පදනමින් යුතුව ඉදිරිපත් කල යුතුය.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍ර කල නොහැක.
- කාලය අවම විනාඩි 05කි. උපරිම විනාඩි 07 කි.
- සහභාගි විය හැකි සංඛ්‍යාව -තරගකරුවන් හැර සහය වාදනය සඳහා උපරිම (ගායන)0.දෙනෙකි 6
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.
- ප්‍රථම ස්ථානය සඳහා "සංගීත් අභිමානි" සම්මානය හිමි වේ.

### 4.1.4 සමූහ ගායනය (විවෘත) ගැහැණු / හින්දි චිත්‍රපට ගී (නිර්දේශිත ගීත)

- Yaara Sili Sili Birha Ki Raat Ka Jalna – Lekin - Lata Mangeshkar
- Taal Se Taal Mila - Taal - Alka Yagnik
- Nimbooda Nimbooda - Hum Dil De Chuke Sanam - Kavita Krishnamurthy
- Dola Re Dola Re Dola - Devdas - Shreya Ghoshal, Kavita Krishnamurthy
- Aaj Phir Jeene Ki Tamanna Hai – Guide - Lata Mangeshkar

### 4.1.5 සමූහ ගායනය (විවෘත) පිරිමි/හින්දි චිත්‍රපට ගී (නිර්දේශිත ගීත)

- Papa Kehte Hain - Qayamat se Qayamat Tak - Udit Narayan
- Dulhe Ka Sehra – Dhadkan - Nusrat Fateh Ali Khan
- Ho Mubarak Tujhe - Ghulam-E-Mustafa - Iqbal Sabri, Afzal Sabri
- hai agar dushman - Hum Kisise Kum Naheen - Mohammed Rafi
- Pal Do Pal Ka Saath Humara - The Burning Train - Mohammed Rafi & Asha Bhosle

### 4.1.6 සමූහ ගායනය (විවෘත) මිශ්‍ර/හින්දි චිත්‍රපට ගී (නිර්දේශිත ගීත)

- Aaja Sanam Madhur Chandani - Chori Chori - Lata Mangeshkar, Manna Dey.
- Gunguna Rahe Hain Bhanware - Aradhana - Mohammed Rafi and Asha Bhosle
- Dil Tadap Tadap Ke – Madhumati - Lata Mangeshkar and Mukesh
- Jo Wada Kiya Woh Nibhana Padega - Taj Mahal - Mohammed Rafi, Lata Mangeshkar
- Dafaliwale Dafali Baja – Sargam - Lata Mangeshkar, Mohammed Rafi

**4.1.4 සිට 4.1.6 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි**

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ මින් එක් තරඟ ශීර්ෂයකට පමණි.
- නම් කොට ඇති චිත්‍රපට ගීයක් තෝරාගෙන පෙර වාදන , අතුරු වාදන ආදී ශිල්පාංග සමග මුල් නාද මාලාවට හානි නොවන පරිදි සමූහ ගායනා අංග වලින් විචිත්‍ර කොට ඉදිරිපත් කළ යුතුය.
- ගායනයට හානි නොවන සේ ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැකිය.
- කාලය - ගීතයට අදාල කාලය ලෙස සලකන්න.
- සහභාගී විය හැකි සංඛ්‍යාව: වාදක මණ්ඩලය හැර අවමය 15 කි. වාදක මණ්ඩලය සමග උපරිම 25 කි.
- වාදක මණ්ඩලයට ගායනයට සහභාගී විය නොහැක.

4.1.7 සමූහ ගායනය(විවෘත) ගැහැණු / කැලිප්සෝ ගීත

4.1.8 සමූහ ගායනය(විවෘත) පිරිමි / කැලිප්සෝ ගීත

4.1.9 සමූහ ගායනය(විවෘත) මිශ්‍ර / කැලිප්සෝ ගීත

(නිර්දේශිත ගීත)

- ගයන ගැයුම් නටන නැටුම් ඉවත හෙලයි ශෝක සුසුම්
- ඉඳුනිල් මිණිකැට පරදවන (රුවන් මාලී)
- නෙත් යුග රන්තරු යුවල තමයි
- උඩරට කඳුකරයේ බැසයන සුන්දරියේ
- ඇත හෙමින් වළාරොදක් පාවෙනවා (වැස්ස වහිනවා)
- වන දෙව්ලිය තුරුලේ සැතපෙන සීගිරියේ

ශීර්ෂයන්ට 4.1.9 සිට 4.1.7අදාළ පොදු කොන්දේසි.

- ඉහත සඳහන් ගීත අතුරින් එක් ගීතයක් තෝරා ගත යුතුය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව - අවමය 06 කි. උපරිමය 08 කි.
- කැලිප්සෝ සම්ප්‍රදායට අදාළ සංගීත භාණ්ඩ - බොක්ස් ගිටාර්/ බැංජෝ ගිටාර්/ කොංගා/ ගයිරෝ/මර්කාස්/ ෂේකර්/ ස්කිෆල් බේස් (තේ පෙට්ටි බේස්)/ කබාෂා /යන භාණ්ඩ අතුරින් කැමති ප්‍රමාණයක් යොදා ගත හැකිය.
- කොංගා ව භාවිත කිරීමේදී කරේ එල්ලාගත් තනි කොංගාව විය යුතුය.
- කණ්ඩායමේ සියලු තරග කරුවන් වාදනයේ යෙදෙමින් ගායනය කළ යුතුය.
- කාලය ගීතයට ගතවන කාලය සේ සලකන්න.
- ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් වලට ද මෙම තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් විය හැකිය.

4.1.10 සමූහ ගායනය (විවෘත) -/ පොදු /ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ශූරීන්ගේ "උදුම්බරා හිනැහෙනවා" ගීතය
(මෙහි ගැහැණු / පිරිමි හෝ මිශ්‍ර වශයෙන් වර්ගීකරණය නොවේ.)

- මේ සඳහා පෞද්ගලික පාසල් සහ ජාත්‍යන්තර පාසල් වලට ද, ඉදිරිපත් විය හැකිය.
- නම් කර ඇති ගීතය පෙර වාදන , අතුරු වාදන ආදී ශිල්පාංග සමග මුල් නාදමාලාවට හානි නොවන පරිදි සමූහ ගායන අංග වලින් විචිත්‍ර කොට ඉදිරිපත් කළ යුතු ය.
- ගායනයට හානි නොවන සේ ප්‍රකාශනාත්මක චලන යොදා විචිත්‍රවත් කළ හැක.
- කාලය - .ගීතයට අදාල කාලය ලෙස සලකන්න -
- සහභාගී විය හැකි සංඛ්‍යාව-වාදක මණ්ඩලය හැර අවමය15 කි. වාදක මණ්ඩලය සමග උපරිම 25 කි.
- වාදක මණ්ඩලයට ගායනයට සහභාගී විය නොහැක.

4.2.1 යුගල වාදනය - (ජොෂ්ඨ-3)/ගැහැණු/ බයාල් හෝ ගත් වාදනය

4.2.2 යුගල වාදනය - (ජොෂ්ඨ-3)/පිරිමි/ බයාල් හෝ ගත් වාදනය

4.2.3 යුගල වාදනය - (ජොෂ්ඨ-3)/මිශ්‍ර/ බයාල් හෝ ගත් වාදනය

4.2.1.සිට 4.2.3 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- මේ සදහා පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වලටද ඉදිරිපත් විය හැක.
- උතුරු ඉන්දියානු රාගයක් යොදා ගත යුතුය.
- යුගල වාදන ශෛලියට උචිතව වාදනය පෙළ ගස්වා ඉදිරිපත් කළ යුතුය.
- සහාය වාදනය සදහා තබ්ලාව සහ ශ්‍රැති භාණ්ඩයක් යොදා ගත හැකිය.
- ඒ අනුව තරගකරුවන් සමග සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිම 04 කි .
- කාලය විනාඩි 5 - 7 දක්වා වේ.
- බැංජො , මැන්ඩලින් ඇතුළුව උත්තර භාරතීය රාගධාරී සංගීතය සදහා යොදා ගන්නා භාණ්ඩ අතුරින් දෙවර්ගයකට අයත් භාණ්ඩ 02 ක් විය යුතුය.
- ඉලෙක්ට්‍රොනික තාම්පුරාව යොදා ගත හැකිය.
- ප්‍රථම ස්ථානය සදහා "සංගීත් අභිමානි" සම්මානය හිමි වේ.

4.2.4 සමූහ ගිටාර් වාදනය - (විවෘත) ගැහැණු / FLAMENCO සරළ ගී අනුවාදනය

4.2.5 සමූහ ගිටාර් වාදනය - (විවෘත) පිරිමි / FLAMENCO සරළ ගී අනුවාදනය

- පනම් අටෙන් මට වැඩිකර දුන්න - ප්‍රවීන ගායන ශිල්පිනී නීලා වික්‍රමසිංහ
- හෙමින් සැරේ පියා විදා - ප්‍රවීන ගායන ශිල්පී ටී.එම්.ජයරත්න
- මලක් උනේ ඇයි නුඹ මට - ප්‍රවීන ගායන ශිල්පී අමරසිරි පීරිස්
- වීයෝ ගී ගැයෙනා - ප්‍රවීන ගායන ශිල්පිනී නීලා වික්‍රමසිංහ
- රන් සමනළයෝ පුංචි කැකුළියෝ - ප්‍රවීන ගායන ශිල්පී සුනිල් එදිරිසිංහ

  යන ගීත අතරින් එක් ගීතයක් තෝරා ගත යුතුය.

- වාදන ශිල්පීන් අවමය 03 කි.උපරිමය 05 කි.
- Classical Guitar පමණක් භාවිත කළ යුතුය.( ලෝහ තත් සහිත , ගිටාර් භාවිතා නොකළ යුතුයි) තාල වාද්‍ය භාණ්ඩ භාවිතා නොකළ යුතුය.
- මුල් ගීතයෙහි ආකෘතිය රැකෙන පරිදි තෝරාගන්නා ගීතයෙහි , අනුවාදනයක් ප්‍රතිනිර්මාණාත්මකව ඉදිරිපත් කළ හැකිය.
- කාලය ගීතයට අදාලව යොදා ගත හැකිය.
- FLAMENCO ශෛලියට අනුව ගී අනුවාදනය කළ යුතුයි.
- මේ සදහා පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වලටද ඉදිරිපත් විය හැක.

4.2.6 සමූහ වාදනය - (විවෘත) තාල වාද්‍ය වෘන්දය

- මේ සඳහා පෞද්ගලික පාසල් සහ ජාත්‍යන්තර පාසල් වලට ද ඉදිරිපත් විය හැකි ය.
- " දුම්රිය " තේමාව යටතේ නිර්මාණය කර ගත් තාල වාද්‍ය අංගයක් විය යුතු ය.
- තබ්ලාව / ගැට බෙරය /පහතරට බෙරය/ දවුල/ දර්බක් / මෘදංග / උඩැක්කි / තම්මැට්ටම / ජෙම්බෙ/ කහෝන් / කොංගා යන තාල වාද්‍ය භාණ්ඩ අතුරින් එක් අයකුට එක් භාණ්ඩය බැගින් අවම වශයෙන් භාණ්ඩ වර්ග පහක් යොදා ගත යුතුය.
- එක් වාදකයකුට තාල වාද්‍ය භාණ්ඩ කිහිපයක් වුවද වැයිය හැකිය.
- වාදන ශිල්පීන් සංඛ්‍යාව 05 ක් විය යුතුය.
- කාලය අවම විනාඩි 03 යි. උපරිම විනාඩි 04 කි.

4.2.7 සමූහ වාදනය -(විවෘත)/ගැහැණු / රාගධාරී සංගීතය ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ /ශිවරංජනී රාගය

4.2.8 සමූහ වාදනය -(විවෘත)/පිරිමි/රාගධාරී සංගීතය ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ/තිලංග රාගය

4.2.9 සමූහ වාදනය - (විවෘත)/මිශ්‍ර / රාගධාරී සංගීතය ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ /කලාවතී රාගය

4.2.10 සමූහ වාදනය - (විවෘත)/පොදු/ රාගධාරී සංගීතය ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ / හංසධ්වනි රාගය

(4.2.10 ශීර්ෂයට සහභාගි විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වලට පමණි. මෙහි ගැහැණු / පිරිමි හෝ මිශ්‍ර වශයෙන් ලෙස වර්ගීකරණය නොවේ.)

ඉහත .4.2.7 සිට .4.2.10 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- එක් පාසලකට සහභාගි විය හැක්කේ මින් එක් ශීර්ෂයකට පමණි.
- රාගධාරී ගුණාංග ඇතුළත් නව නිර්මාණයක් විය යුතුය.
- .කාලය - අවම විනාඩි 05 කි.උපරිමය විනාඩි 07 කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව(හසුරුවන්නා ද ඇතුළුව) වාදක මණ්ඩලය අවම 20 කි.උපරිම 25 කි.
- ඕනෑම උචිත සංගීත භාණ්ඩයක් රාගධාරී ගුණාංග සුරැකෙන පරිදි භාවිත කළ හැකි අතර පියානෝව, ආදේශ භාණ්ඩ සහ විද්‍යුත් භාණ්ඩ භාවිත කල නොහැක.(මීන්ඩ්, සම්ට්, ගමක්, මූර්කි, ආන්දෝලන්, කන් වැනිශිල්ප ක්‍රම සහ රාග සංගති නිවැරදිව භාවිත කිරීමෙන් රාගධාරී ගුණාංග සුරැකේ)
- තාලානුකූල නිර්මාණයක් විය යුතු අතර ශිල්පීය මට්ටමින් ඉදිරිපත් කල යුතුවේ.

4.2.11 සමූහ වාදනය - (විවෘත)/ගැහැණු / ජන ගී ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ

4.2.12 සමූහ වාදනය - (විවෘත)/පිරිමි / ජන ගී ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ

4.2.13 සමූහ වාදනය - (විවෘත)/මිශ්‍ර / ජන ගී ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ

4.2.14 සමූහ වාදනය - (විවෘත)/පොදු/ ජන ගී ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ

(4.2.14 ශීර්ෂයට සහභාගී විය හැක්කේ පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වලට පමණි.)

(මෙහි ගැහැණු / පිරිමි හෝ මිශ්‍ර වශයෙන් ලෙස වර්ගීකරණය නොවේ.)

ඉහත 4.2.11 සිට 4.2.14 දක්වා ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- එක් පාසලකට ඉදිරිපත් විය හැක්කේ ඉහත එක් තරග ශීර්ෂයකට පමණි.
- දේශීය ජන නාද මාලා පදනම් කරගත් ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතුය .
- වාදකයකුට භාණ්ඩ කීපයක් වුවද වාදනය කළ හැකි අතර කටහඬ යොදා ගත නොහැකිය. .(ආදේශ භාණ්ඩ, විද්‍යුත් භාණ්ඩ හෝ පියානෝව යොදා ගත නොහැක)
- දවුබෙරය යොදා ගත හැකිය
- ඕනෑම සංගීත පද්ධතියක් , සම්ප්‍රධායක් , ශෛලියක් හෝ ශිල්පක්‍රමයක් යොදා ගත හැකි අතර ඒවා වෙන් වෙන් වශයෙන් හෝ සංකලනයක් වශයෙන් හෝ ඉදිරිපත් කිරීමේ නිදහස ඇත.
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 07 කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව (හසුරුවන්නාද ඇතුළුව) අවමය 20 කි. උපරිම 25 කි.

4.2.15 සමූහ වාදනය - (විවෘත)/ගැහැණු / ස්වතන්ත්‍ර නිර්මාණ - තේමාව - හිමිදිරිය

4.2.16 සමූහ වාදනය - (විවෘත)/පිරිමි / ස්වතන්ත්‍ර නිර්මාණ - තේමාව - වැස්ස

4.2.17 සමූහ වාදනය - (විවෘත)/මිශ්‍ර / ස්වතන්ත්‍ර නිර්මාණ - තේමාව - සඳ එළිය

4.2.18 සමූහ වාදනය - (විවෘත)/ ගැහැණු /ස්වතන්ත්‍ර නිර්මාණ - තේමාව - රාත්‍රිය

4.2.19 සමූහ වාදනය - (විවෘත)/ පිරිමි / ස්වතන්ත්‍ර නිර්මාණ - තේමාව - සුළඟ

(ඉහත 4.2.18 සහ 4.2.19 ශීර්ෂ දෙකට සහභාගී විය හැක්කේ, 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් සඳහා පමණි.)

ඉහත 4.2.15 සිට 4.2.19 ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි

- සංගීතමය වශයෙන් තේමාව මතුවන අයුරින් නිර්මාණය සිදු කල යුතුය .
- වාදකයකුට භාණ්ඩ කිහිපයක් වුවද වාදනය කළ හැකි අතර කටහඬ යොදා ගත නොහැක. (ආදේශ භාණ්ඩ , විද්‍යුත් භාණ්ඩ සහ පියානෝව යොදා ගත නොහැකිය )
- දවුබෙරය යොදා ගත හැකිය.
- ඕනෑම සංගීත පද්ධතියක් , සම්ප්‍රධායක් , ශෛලියක් හෝ ශිල්පක්‍රමයක් යොදා ගත හැකි අතර ඒවා වෙන් වෙන් වශයෙන් හෝ සංකලනයක් වශයෙන් හෝ ඉදිරිපත් කිරීමේ නිදහස ඇත.
- කාලය අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 07 කි.
- සහභාගී විය හැකි සංඛ්‍යාව (හසුරුවන්නාද ඇතුළුව) අවමය 20 කි.උපරිම 25 කි.

4.3.1 (විවෘත) නෘත්‍ය නිර්මාණ - කථක්(සමූහ)

- ගැහැණු/පිරිමි/මිශ්‍ර ලෙස වර්ග කරනු නොලැබේ.
- මේ සඳහා පෞද්ගලික පාසල් සහ ජාත්‍යන්තර පාසල් වලට ද, ඉදිරිපත් විය හැකිය.
- උතුරු ඉන්දීය අර්ධ ශාස්ත්‍රීය ගීතයක් සඳහා ශාස්ත්‍රීය කථක් නෘත්‍යයක් විය යුතුය.
- සහභාගි විය හැකි සංඛ්‍යාව - නර්තනය සඳහා අවමය 04.උපරිමය 06. වාදනය සඳහා අවමය 04. උපරිමය 06. ගායනය සඳහා 01. තාල පද කීම (පඩන්ත්) සඳහා 01යි. (අවශ්‍ය නම් පමණි)
- කාලය අවම විනාඩි 04 යි. උපරිමය විනාඩි 06 යි.
- අදාල ගීත ශෛලීන් - භජන් , ඨුම්රි , ගසල්
- ගීතයේ භාෂාව - හින්දි , ව්‍රජ් , උර්දු යන එක් භාෂා මාධ්‍යක් විය යුතුය.
- ගායන, වාදන හා නර්තනයෙහි සුසංයෝගී බවත්, ගී අර්ථයට අනුකූල බවත්, අභිනය, තාල හා ප්‍රාසාංගික බවත් ඇගයීමට ලක් කෙරේ. සාම්ප්‍රදායික ශාස්ත්‍රීය පිළිවෙල අනුගමනය කල යුතුයි.
- වේදිකා පසුතල නිර්මාණ හා රංග භාණ්ඩ භාවිත නොකළ යුතුය.

4.3.2 (විවෘත) නාට්‍ය නිර්මාණ - ගීත නාට්‍ය(සමූහ)

- කිසියම් තේමාවකට අනුව නාට්‍යෝචිත අවස්ථාවක් සහිතව සියලුම දෙබස් ගීතාත්මකව ඉදිරිපත් කළ හැකි ආකාරයෙන් නිර්මාණය කරගත් ගීත නාට්‍යයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතුය.
- සංගීත නිර්මාණය කිරීමේදී ශ්‍රී ලාංකික ජන සංගීතය හෝ හින්දුස්ථානි රාගධාරී සංගීතය ඇසුරින් නිර්මාණය කළ යුතු අතර ව්‍යවහාරික සංගීත ශිල්ප ක්‍රම භාවිත කරමින් වර්ණවත් කළ හැකිය.
- සියලුම චරිත ගායනය කරමින් රඟපෑම් කළ යුතු අතර වෙනම අත්වැල් ගායනය කළ නොහැකිය.
- ආදේශ භාණ්ඩ, විද්‍යුත් භාණ්ඩ හා පියානෝව හැර ඕනෑම භාණ්ඩයක් භාවිත කල හැක.
- දඬුබෙරය යොදා ගත හැක.
- සහභාගි විය හැකි අවම සංඛ්‍යාව 15 කි. උපරිම 25 කි.
- කාලය අවම විනාඩි 12 කි. උපරිම විනාඩි 15 කි.

4.3.3 (විවෘත) ශෛලිගත නාට්‍ය ජවනිකා - (සමූහ) - ගැහැණු

- සහභාගී විය හැකි සංඛ්‍යාව
  - i. වාදක මණ්ඩලය - උපරිම 06 කි. (ගැහැණු /පිරිමි ලෙස වර්ග නොවේ)
  - ii. ගායක කණ්ඩායම - උපරිම 06 කි. (ගැහැණු පමණයි)
  - iii. රංගනය - ජවනිකාවට නියමිත සංඛ්‍යාව (ගැහැණු පමණයි)

4.3.4. (විවෘත) ශෛලිගත නාට්‍ය ජවනිකා - (සමූහ) - පිරිමි

- සහභාගී විය හැකි සංඛ්‍යාව
  - I. වාදක මණ්ඩලය - උපරිම 06 කි. (ගැහැණු /පිරිමි ලෙස වර්ග නොවේ)
  - II. ගායක කණ්ඩායම - උපරිම 06 කි. (පිරිමි පමණයි)
  - III. රංගනය - ජවනිකාවට නියමිත සංඛ්‍යාව (පිරිමි පමණයි)

ඉහත 4.3.3 සහ 4.3.4 තරඟ ශීර්ෂයන්ට අදාළ පොදු කොන්දේසි.

- සිංහබාහු නව නාට්‍යයේ එන 'ගල්ලෙන බිඳලා' ගීතය
  ( පොතේ ගුරු විසින් ගයන "පසෙක වැටී ලෙන හිස්ව තිබී අයුරු, දැඩි සොවින් ගොස නගයි වනපෙත කරන දුරු" දෙබස අවසානයේ සිට ගල්ලෙන බිඳලා ගීතයේ " ඔහුගේ අණටද කිකරු වූයේ පෙරලා එන්නෙද ඔහුගෙන් ගැලවී" ලෙස ගීතය අවසන් වන තෙක් කොටස පමණි.
- මේ සඳහා පෞද්ගලික පාසල් සහ ජාත්‍යන්තර පාසල් වලට ද, ඉදිරිපත් විය හැකිය.
- කාලය - දී ඇති ප්‍රාසංගික කොටසට ගතවන නියමිත කාලය.
- යොදා ගත හැකි සංගීත භාණ්ඩ (මද්දල , හාර්මෝනියම් , වයලීනය , බටනලාව , තාලම්පට , ගෙජ්ජි)
- දෙබස් ,ගී පද හා තනු වෙනස් කිරීම සිදු නොකල යුතු අතර නාට්‍ය පවනිකාව එපරිද්දෙන් ම ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ.

## 05. විශේෂ කොටස (11 – 13 ශ්‍රේණිවල සුභග සිසුන් සඳහා).

5.1.1 ඒකල ගායනය (විශේෂ) / ගැහැණු / රාගධාරී / ඛ්‍යාල් ශෛලියේ ශාස්ත්‍රීය ගායනය.

5.1.2. ඒකල ගායනය (විශේෂ) / පිරිමි / රාගධාරී / ඛ්‍යාල් ශෛලියේ ශාස්ත්‍රීය ගායනය.

- මේ සඳහා පෞද්ගලික පාසල් වලට සහ ජාත්‍යන්තර පාසල් වලට ද ඉදිරිපත් විය හැකිය.
- එසැනින් නිර්මාණාත්මකව ගැයීම(උපජ් භාවිතය)ප්‍රධාන ඇගයීම් නිර්ණායකය වේ.
- භෛරව, දර්බාරි කානඩා, මාර්වා, තෝඩී, පූර්වී යන රාග වලින් එකක් තෝරා ගත යුතුය.
- හිංදි බසින් රචිත විලම්භ සහ මධ්‍ය හෝ ධෘත ලයෙන් යුතු ගීත ගායනය කල යුතුය.
- අතිශය ශාස්ත්‍රීය බව සහ ප්‍රාසංගික ශිල්පීය මට්ටම අපේක්ෂා කෙරේ.
- වෙනත් ගායන ශෛලීන් මිශ්‍රකල නොහැක.
- එසැනින් නිර්මාණාත්මකව ගැයීම(උපජ් ) ,ආලාප ,මධ්‍ය ආලාප ,තානාලංකාර සහ ගායන මාධ්‍ය සංවර්ධනය කල යුතුය.(මෙම කුසලතාව ඇගයීම සඳහා විනිසුරුවන් විසින් අපේක්ෂිත අවස්ථා තුනකදී(උපරිම වශයෙන්) මධ්‍ය ආලාප සහ තානාලංකාර ගායනය අතරතුර මදකට නවකාලීමට උපදෙස් දුන් පසු ,නැවත විනිසුරුවරුන් දෙනු ලබන සංඥාවකදී මධ්‍ය ආලාප තානාලංකාර ගායනය ආරම්භ කොට තබ්ලාව සමග නිවැරදිව බද්ධ විය යුතුය.එහිදී නිවැරදි ලෙස තම කුසලතාව දැක්වීමට අපොහොසත්වන තරඟකරුවන් ජයග්‍රහණයට සුදුසුකම් නොලබයි.)
- විනිශ්චය මණ්ඩලය විසින් තරඟකරුගේ රාගාවබෝධය පිළිබඳ වාචික විමසා බැලීමක් ද ගායනය ඉදිරිපත් කිරීමෙන් පසුව සිදු කෙරෙනු ඇත.
- කාලය අවම විනාඩි 10 කි. උපරිමය විනාඩි 12 කි.( විනිසුරුවරුන් සිදු කරන වාචික ඇගයීම් කාලය විනාඩි තුනක් ලෙස සලකා,උපරිම කාලය විනාඩි 15 දක්වා ලෙස ගැනේ)
- තරඟකරු හැර සහාය වාදකයින් උපරිම 05 කි.
- ප්‍රථම ස්ථානය සඳහා "සංගීත් ප්‍රවීන් "සම්මානය හිමිවේ.